2020
ජනවාරි



# පෙර දැක්ම 2020

## 2020 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# පෙර දැක්ම:
# 2020 සහ ඉදිරිය සඳහා මුදල් සහ
# මූල්‍ය අංශ ප්‍රතිපත්ති

**ඉදිරිපත් කිරීම**

**මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්**

**අධිපති**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

***2020 ජනවාරි 06***

# 1. හැඳින්වීම

සම්භාවනීය අමුත්තනි, මුදල් මණ්ඩල සාමාජිකයිනි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිතුමනි, නියෝජ්‍ය අධිපතිතුමනි, සහකාර අධිපතිවරුන් ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරී මහත්ම මහත්මියනි, විශේෂ ආරාධිත අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ 15 වන අධිපතිවරයා වශයෙන් ඔබ ඇමතීමට ලැබීම ඉමහත් ගෞරවයක් වශයෙන් සලකමි. මෙම ගෞරවනීය සහ කීර්තිමත් තනතුරට පත්වීමට ලැබීම මට ලැබුණු වරප්‍රසාදයක් ලෙස සලකන අතර, එය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායක වීමට ලද වටිනා අවස්ථාවක් ලෙස සලකමි. මෙම භාරදූර වගකීම් සහිත තනතුරේ හෘද සාක්ෂියට එකඟව දැඩි කැපවීමෙන් යුක්තව මාගේ රාජකාරි ඉටු කිරීමට මම ප්‍රතිඥා දෙමි. මහ බැංකුවේ ගෞරවය සහ විශිෂ්ඨත්වය පවත්වා ගැනීමට හා වර්ධනය කිරීමටත් එය පසුගිය දශක හත පුරා ගොඩ නගාගත් උසස් සම්ප්‍රදායන් තවදුරටත් පවත්වා ගැනීමටත් මාගේ උපරිමයෙන් කටයුතු කරන බවට නැවතත් අවධාරණය කරන්නට කැමැත්තෙමි.

වර්තමානයේදී, ශ්‍රී ලංකා ආර්ථිකය පවතිනුයේ තීරණාත්මක සන්ධිස්ථානයකය. ස්වෛරී රාජ්‍යයක් ලෙස දශක ගණනාවක් පුරා සිදු කළ ප්‍රතිපත්ති සම්පාදනය තුළින් ආර්ථිකයේ බොහෝ අංශ ප්‍රගතියක් ලබාගෙන ඇත. සාමාජීය වශයෙන් ගත් කල කැපී පෙනෙන අභිවෘද්ධියක් ළඟා කරගෙන ඇත. කෙසේ වුවත්, විභව මට්ටමට වඩා අඩු ආර්ථික වර්ධනය, යම් ප්‍රදේශ හා ජන කොටස්වලට සීමා වූ ඉහළ දරිද්‍රතාවය දිගින් දිගටම පැවතීම, ඵලදායී සම්පත් ඌන උපයෝජනය, අපනයනවල වර්ධනය සහ විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම, ණය නොවන ප්‍රාග්ධන ලැබීම්වල හිඟතාව, විශාල ණය සහ පොලී අනුපාතික කාලපරිච්ඡේද සහ ඉහළ රාජ්‍ය මූල්‍ය හිඟයන් හා රාජ්‍ය ණය මට්ටම් යනාදිය ආර්ථිකයේ දැඩි අභියෝග ලෙස පවතී. ඉහළ සහ තිරසාර වර්ධන මාවතකට ආර්ථිකය රැගෙන යෑම සඳහා ප්‍රතිපත්තිමය සහ ප්‍රතිපත්තිමය නොවන සාධකවල ප්‍රතිඵලයක් වූ මෙම අභියෝගයන්ට තීරණාත්මක ලෙස මුහුණ දීම අත්‍යවශ්‍ය වේ. එවැනි ඉහළ ආර්ථික වර්ධනයක ප්‍රතිලාභ සමාජය

පුරා සාධාරණව බෙදා හැරීම සහ සියලු දෙනාට අවස්ථා විවර කිරීම අත්‍යවශ්‍ය වන අතර, එය ආදායම්වල සහ අවස්ථාවල සාධාරණ ව්‍යාප්තියක් ද සමඟ ශ්‍රී ලංකාව වඩාත් සෞභාග්‍යමත්, සතුටුදායක හා තෘප්තිමත් දේශයක් බවට පත් කිරීමට හේතු වනු ඇත. එවැනි ප්‍රතිඵලයක් සඳහා නවමු අදහස් ඇසුරින් සැකසෙන නව්‍ය ප්‍රතිපත්ති අවශ්‍ය වේ.

මෙම පසුබිම ද සමඟින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්මෙහි 13 වන ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අවස්ථාවට සපැමිණි ඔබ සියලු දෙනා මම සාදරයෙන් පිළිගනිමි. මෙම ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් සහශ්‍රයේ තෙවන දශකය වෙත පිය නගමින්, 2020 වසර සඳහා වන මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති දිශානතිය ඉදිරිපත් කරනු ලැබේ. අවශ්‍ය කෙරෙන මහජන සංවාදය ගොඩ නැගීම සඳහා මෙය අපගේ මැදිකාලීන ප්‍රතිපත්තිවල විනිවිදභාවය වර්ධනය කිරීමට දායක වනු ඇතැයි අපි විශ්වාස කරමු. එවන් සංවාදයන් අපගේ ප්‍රතිපත්ති මනා ලෙස සකසා ගැනීමට සහ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට උපකාරී වන අතර, එමගින් ආර්ථික වර්ධනයට, සංවර්ධනයට සහ සමාජ සුභ සාධනයට දායක වෙමින් සාර්ව ආර්ථික ස්ථායීතාව වර්ධනය වනු ඇත.

2019 වසර තුළ ආර්ථික ක්‍රියාකාරිත්වය සහ මහ බැංකුවේ ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ කෙටි විශ්ලේෂණයක් සමඟ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම ආරම්භ කරමි.

ගෝලීය ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය මෙන්ම රට තුළ පැවති විවිධ ප්‍රවණතා හේතුවෙන් 2019 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය දැඩි අභියෝගයන්ට මුහුණ දුන්නේය. ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් පවත්නා තත්ත්වයන්, වෙළඳාම හා සම්බන්ධ බාධක ඉහළ යෑම, භූ දේශපාලනික අස්ථාවරතා සහ විවිධ ව්‍යූහාත්මක අභියෝග හේතුවෙන් ලෝකයේ බොහෝ ආර්ථිකයන්හි ක්‍රියාකාරිත්වයන් මන්දගාමී වීම නිසා එක් වසරක් තුළ ලොව පුරා මුදල් ප්‍රතිපත්ති දැඩි ස්ථාවරයේ සිට ලිහිල් ස්වභාවයකට වෙනස් විය. පසුගිය කාලයේ දී ගෙවුම් තුලනය සහ රාජ්‍ය මූල්‍ය ශේෂ ස්ථාවරත්වයක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කළ රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති

පියවරයන්ගේ බලපෑම, පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ අහිතකර ප්‍රතිඵල මෙන්ම එවකට පැවති දේශපාලන අස්ථාවරතා තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස මන්දගාමී විය. විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුව තුළදී, පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ බලපෑම ආර්ථිකයේ සියලුම අංශවල ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස පැතුරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විභව මට්ටමට වඩා අඩු ආර්ථික වර්ධන තත්ත්වයක් 2019 වසර පුරා අඛණ්ඩව දක්නට ලැබුණි. 2019 වසරේ පළමු මාස නවය තුළ දී ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 2.6 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. සමස්ත වසර සඳහා වූ ආර්ථික වර්ධන අනුපාතය බොහෝ දුරට සියයට 2.8 ක් පමණ වනු ඇත. 2019 වර්ෂයට ආසන්න පෙර වර්ෂවල දී ද ආර්ථික වර්ධනය මන්දගාමී වූ අතර, රටේ පැවති අභ්‍යන්තර අර්බුදය අවසාන වීමත් සමඟ ආසන්න වසරවල දී දක්නට ලැබුණු ඉහළ ආර්ථික වර්ධන ප්‍රවණතාවය පවත්වා ගැනීමට රට අපොහොසත් වී ඇත. ප්‍රතිපත්ති අස්ථාවරතා, ආයෝජකයින්ගේ විශ්වාසය දුර්වල කිරීමටත් ආයෝජන අඩු වීමටත් හේතු විය. නැවත නැවතත් හටගන්නා ස්වභාවික ව්‍යසන මෙම තත්ත්වය තවදුරටත් අයහපත් කළේය. නිෂ්පාදන ආර්ථිකය දුර්වල වීමට හේතු වූ ව්‍යුහාත්මක ගැටලුවලට විසඳුම් සෙවීමට අපොහොසත් වීම  මෙම අඛණ්ඩ මන්දගාමිත්වයට හේතු විය. රජය සහ අනෙකුත් බලධාරීන් සමඟ එක්ව භෞතික හා මානව සම්පත් යන දෙඅංශයේම පවතින දේශීය සම්පත් උපයෝජනය වර්ධනය කිරීම හරහා මූර්ත වශයෙන් ආර්ථික කටයුතු තිරසාරව යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. මහා පරිමාණව ඵලදායී රැකියා අවස්ථා බිහිකිරීමේ රජයේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට මෙමගින් හැකියාව ලැබෙනු ඇත. පසුගිය දශක කිහිපය පුරා රටෙහි ක්‍රියාත්මක කෙරුණු සහනාධාර මත පදනම් වූ දිළිඳු බව පිටු දැකීමේ ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මක කිරීම වෙනුවට, එසේ රැකියා අවස්ථා ඇති කිරීම මගින් මහජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය වීම තිරසාරව සිදු වනු ඇත. පසුගිය කාලයේ දී ක්‍රියාත්මක කළ සුභසාධන ප්‍රතිපත්ති, විශේෂයෙන්ම අධ්‍යාපන සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාව ඉහළ මානව සංවර්ධනය සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රතිඵල අත්කර ගෙන ඇත. පසුගිය වසරවල දී ගොඩ නගන ලද මානව සම්පත සහ මැදි හා දිගුකාලීන ප්‍රතිපත්ති මත පදනම් වූ නව ආයෝජන නිෂ්පාදනයේ වර්ධනය ඉහළ දැමීමට සහ ඵලදායී රැකියා අවස්ථා

ඉහළ නැංවීම සඳහා උපයෝජනය කර ගැනීමට කාලය එළඹ ඇත. එසේ දරිද්‍රතාවය තුරන් කිරීමට මෙන්ම තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමවේදය වන්නේ එවැනි රැකියා අවස්ථා වැඩි කෙරෙන ආර්ථික වර්ධනයක්ය.

උද්ධමනය සැලකූ විට, රටෙහි උද්ධමනය පසුගිය අවුරුදු එකොළහක කාල පරිච්ඡේදයේ දී තනි අගයක මට්ටමේ පැවතුණි. රටෙහි ආර්ථික සහ මිල ස්ථායීතාව සහතික කිරීම මහ බැංකුවට පැවරී ඇති වගකීම වන අතර, මෙම ජයග්‍රහණය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අපි ආඩම්බර වන්නෙමු. ශ්‍රී ලංකාව 1977 න් පසුව ඉහළ විචලනයක් සහ බොහෝ විට අංක දෙකක මට්ටමේ පැවති උද්ධමන ප්‍රවණතාවයෙන් මිදී ඇති බව දැන් පෙනී යයි. කෙසේ වෙතත්, මෙම පහළ උද්ධමන තත්ත්වයන් පසුපස සමස්ත ඉල්ලුමේ ඇති වූ මන්දගාමී තත්ත්වයන් ද පවතී. මෙමගින් ආර්ථිකයේ නිෂ්පාදන පරතරයක් පිළිබිඹු වන අතර එය දැනට පවත්නා ප්‍රතිපත්ති අවකාශය උපයෝගී කර ගනිමින් කඩිනමින් අඩු කළ යුතුය. මෑත අතීතයේදී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති රාමුවක් මත පදනම් විය. මෙය ලොව පුරා සිදුවන බුද්ධිමය සංවාදයේ මාතෘකාවකි. මහ බැංකුව මෙම ක්ෂේත්‍රයේ සිය ප්‍රතිපත්ති රාමුව අඛණ්ඩව වැඩිදියුණු කරනු ඇති අතර, එහිදී මූර්ත අංශයේ වර්ධනය සඳහා මුදල් ප්‍රතිපත්තියේ ස්ථායීතාව ඇති විය යුතු ආකාරය පිළිබඳව නිසි අවධානයක් යොමු කරනු ඇත. උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ පවත්වා ගැනීම සාර්ව ආර්ථික ස්ථායීතාවයේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එමගින් ජනගහනයේ අවදානමට ලක් විය හැකි කොටස් ආරක්ෂා වනු ඇත. එමෙන්ම, උද්ධමනය අඩු මට්ටමක පවතින විට දී, ඊට සමානව නැතහොත් වඩා වැදගත් වන්නේ, ප්‍රතිලාභ බෙදී යන සහ රැකියා අවස්ථා ඇති කෙරෙන අයුරින් නිෂ්පාදනය වර්ධනය වීමයි.

ඉහළ ණය හා මුදල් ප්‍රසාරණය සහ අහිතකර ගෙවුම් තුලන පීඩනයන් සැලකිල්ලට ගනිමින් මහ බැංකුව 2018 වසර දක්වා දැඩි මුදල් ප්‍රතිපත්තිමය ස්ථාවරයක් අනුගමනය කළේය. ආර්ථික වර්ධනය පහළ මට්ටමක පැවතීම, උද්ධමන පීඩන අඩු වීම සහ ඉහළ නාමික හා මූර්ත වෙළඳපොළ පොලී අනුපාතික හමුවේ පෞද්ගලික

අංශයෙහි ණය වර්ධනය ශීඝ්‍රයෙන් අඩු වීම වැනි තත්ත්වයන් හේතු කොටගෙන වර්තමානයේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වාගෙන යනු ලබයි. මහ බැංකුව විසින් වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2018 වසරේ නොවැම්බර් මාසයේදී සහ 2019 මාර්තු මාසයේදී සමස්තයක් ලෙස සියයට 2.50 කින් අඩු කළේය. එහි අරමුණ දේශීය මුදල් වෙළඳපොළ වෙත ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ලබා දීමයි. ගෝලීය ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි ස්වභාවය ද සැලකිල්ලට ගනිමින් මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික පියවර දෙකකින්, එනම් පළමුව 2019 මැයි සහ අනතුරුව අගෝස්තු මාසවලදී, පදනම් අංක 100 කින් අඩු කළේය.

ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කළ ද, නාමික සහ මූර්ත වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතුණි. පෞද්ගලික අංශයෙහි ණය වර්ධනය විශේෂයෙන්ම 2019 මුල් භාගයේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. මූල්‍ය ආයතනවල තැන්පතු පොලී අනුපාතික සඳහා උපරිම සීමා පැනවීමේ නියාමන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට මහ බැංකුව යොමු කිරීමට මෙය හේතු විය. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල අපේක්ෂිත බලපෑම මුදල් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීමේදී පැවති දුර්වලතා විසඳීම සඳහා 2019 අප්‍රේල් මාසයේ දී මෙය සිදු කරන ලදී. තැන්පතු පොලී අනුපාතික සහ අරමුදල්වල පිරිවැය අඩුවීමත් සමඟ මහ බැංකුව විසින් බැංකුවල තැන්පතු පොලී අනුපාතික සඳහා පනවා තිබූ උපරිම සීමා ඉවත් කළ අතර 2019 සැප්තැම්බර් මාසයේ දී බලපත්‍රලාභී බැංකුවල පොලී අනුපාතික සඳහා උපරිම සීමා පැනවීය. ආර්ථික වර්ධනය නැවත යථා තත්ත්වයට පත් කිරීමට සහය වීම සඳහා ණය අනුපාතික සැලකිය යුතු ලෙස අඩු කිරීම තුළින් ණය ප්‍රවාහ වැඩි කිරීම මෙහි අරමුණ විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ වෙළඳපොළ පොලී අනුපාතික 2019 වසරේ දෙවන භාගය තුළ දී සැලකිය යුතු ලෙස අඩු විය. මූල්‍ය ආයතන විසින් ණය අනුපාතික අඩු කිරීම සහ ණය ප්‍රවාහ වසර තුළ දී සාමාන්‍ය තත්ත්වයට පත් වූ විට ණය අනුපාතික මත පනවා ඇති උපරිම සීමා සමාලෝචනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

මුදල් හා රාජ්‍ය මූල්‍ය සානුබල පවතින පරිසරයක, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ණය ඉහළ නැංවීම සඳහා නුදුරු අනාගතයේ දී පියවර ගැනීමට නියමිතය. මෙම ක්‍රියාමාර්ග තුළින් 2020 වර්ෂයේ සහ ඉන් ඉදිරියට පෞද්ගලික අංශය වෙත වූ ණය වර්ධනය වේගවත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ආර්ථික කටයුතු වේගවත්ව නැවත යථා තත්වයට පත් කිරීමට දායක වනු ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් යළි නඟා සිටුවීම සඳහා, විශේෂයෙන්ම අක්‍රීය අත්තිකාරම් ඉලක්ක කර ගනිමින් සහන පැකේජයක් සකස් කරමින් පවතී. මෙම පැකේජය යටතේ සහන අපේක්ෂා කරන්නන් සඳහා ණය හා සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග අත්හිටුවීම සහ අක්‍රීය ණය ක්‍රියාකාරී ණය බවට නැවත සකස් කිරීම සමඟ පොලී අනුපාතික සහනයක් ලබාදීම ද යෝජනා කර ඇත. එවැනි ණයගැතියන්ගේ ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබාදීම සහ කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය සැපයීම හරහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සක්‍රීය කාණ්ඩයේ සිටින ණය ගැණුම්කරුවන් සඳහා, සාධාරණ පොලී අනුපාතික යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම් සඳහා සහන කාලයක් ඇතුළුව ආපසු ගෙවීමේ කාලසීමාවන් දීර්ඝ කරනු ලැබූ නව පහසුකමක් පිළිබඳ සලකා බලනු ලැබේ.

මෙම පසුබිම තුළ, නැගී එන ව්‍යවසායකයින්ට  හා නව ව්‍යාපාරවලට අවශ්‍ය ආරම්භක ප්‍රාග්ධනය සැපයීමට බාධා වන සාම්ප්‍රදායික "අවදානම් දැරීමට අකමැති" මානසිකත්වයෙන් මිදී, බැංකු අංශය තම ණය ලබාදීමේ  ප්‍රතිපත්ති පිළිබඳව නැවත සිතා බලන ලෙසට මම යෝජනා කරමි. තවද, නව ව්‍යවසායකයින් මුහුණ දෙන නිශ්චිත අභියෝග සැලකිල්ලට ගෙන සැකසෙන ණය යෝජනා ක්‍රම බිහිවී නැත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නැගී සිටීම උදෙසා බැංකු අංශයේ සහාය අවශ්‍ය අවස්ථාවන්හිදී, විශේෂයෙන්ම රට මුහුණ දුන් ආර්ථික පසුබෑම් අවස්ථාවන්හිදී මෙන්ම ශීඝ්‍ර වර්ධන මාවතක් සඳහා ආර්ථිකය යොමු විය හැකි (උඩ්ඩායනය) ඉදිරි කාල පරිච්ඡේදය තුළ දී සංවර්ධනය සඳහා ම වෙන් වූ මූල්‍ය ආයතන නොමැතිවීමේ පාඩුව දැඩි ලෙස දැනේ.

2018 වසරේදී සැලකිය යුතු පීඩනයන්ට මුහුණ දුන් බාහිර අංශය 2019 වසරේදී යම් දුරකට යථා තත්ත්වයකට පත් විය. පෞද්ගලික මෝටර් රථ සහ රත්‍රන් ඇතුළු අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා 2018 වසරේ මැද භාගයේ දී ගනු ලැබූ ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් ආනයන සැලකිය යුතු ලෙස පහළ යෑම නිසා වෙළඳ හිඟය අඩුවිය. පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් සංචාරක අංශයට ඇති වූ ඍණාත්මක බලපෑම හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ වීමේ බලපෑම සමනය කිරීමට මෙය බෙහෙවින් ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. මූල්‍ය ප්‍රවාහ ගත් කල, ශ්‍රී ලංකාවට විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඛණ්ඩව පහළ මට්ටමක පැවතුණි. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවත් අඛණ්ඩ ගෙවීම් වාර්තා විය. ජංගම ගිණුමේ අඛණ්ඩ හිඟය සහ ණය නොවන මූල්‍ය ප්‍රවාහය ලැබීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රජයට ලැබෙන ණය මත තවදුරටත් රඳා පැවතීමට රටට සිදු විය. ශ්‍රී ලංකාව 2019 වසර තුළදී එ.ජ.ඩොලර් බිලියන 4.4 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථකව නිකුත් කළේය. 2018 වසරේදී සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමෙන් පසුව ශ්‍රී ලංකා රුපියල ඉහළ ස්ථාවරත්වයක් පෙන්නුම් කර ඇත. 2010 වසරට පසු ප්‍රථම වරට 2019 වසරේදී රුපියල සුළු වශයෙන් අතිප්‍රමාණයක් වාර්තා කළේය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි හිතකර තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුවට වසර තුළදී සංචිත ගොඩ නැගීම සඳහා විදේශ විනිමය මිලදී ගැනීමට හැකි විය. ඉදිරි කාලයේ දී, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පැවතීම, අපනයන අරමුණු කරගත් විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ යෝග්‍ය රාජ්‍ය මූල්‍ය හා මුදල් තත්ත්වයන් පවත්වාගෙන යෑම තුළින් නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කෙරෙනු ඇත. තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑම ද මෙහිදී උපකාරී වනු ඇත. රටෙහි ගෙවුම් තුලනයේ තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට මෙම කරුණු හේතු වනු ඇත.

2019 වසර තුළදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි පස්වන සහ හයවන සමාලෝචන සාර්ථකව සිදු කළ අතර, හයවන

හා හත්වන වාරික ද ශ්‍රී ලංකාව වෙත ලැබුණි. වෙනස්කම් අවශ්‍ය යැයි සලකනු ලබන අංශයන්හි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනෙහි වෙනස්කම් සිදු කිරීමට සාකච්ඡා කරමින්, සමස්ත ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රැඳෙමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යෑමට අපි බලාපොරොත්තු වෙමු.

මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හමුවේ රාජ්‍ය ආදායම් එක් රැස් කිරීම දුර්වල වීම හේතුවෙන් 2019 වසරේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල එහි අපේක්ෂිත ඉලක්කවලට වඩා වෙනස් විය. අපේක්ෂිත මට්ටමට වඩා අඩු වුවද, 2019 වසරේ දී ප්‍රාථමික ශේෂයෙහි අතිරික්තයක් අපේක්ෂා කෙරේ. මෑතකාලීන බදු ප්‍රතිසංස්කරණ රටෙහි බදු ක්‍රමය වඩාත් සරල කිරීම සඳහා අත්‍යවශ්‍ය පරිවර්තනයක් වේ. දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති බදු සහන ක්‍රියාමාර්ග, ව්‍යාපාරික ප්‍රජාවගේ විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරීව දායක වෙමින් ආර්ථිකය නැවත ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද බදු සංශෝධන හේතුවෙන් ආදායමේ කිසියම් හිඟයක් ඇති වේ නම්, එය ඵලදායී නොවන වර්තන වියදම් ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාගත කිරීම තුළින් විශාල වශයෙන් පියවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවත නොවෙනස්ව පවතිනු ඇතැයිද රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වාගෙන යෑමට හැකිවනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

මූල්‍ය පද්ධතියේ අඛණ්ඩ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා 2019 වසර තුළ දී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, මූල්‍ය පද්ධතියේ ශක්තිමත්භාවය වර්ධනය කරමින් ගෝලීය හා දේශීය කම්පනවලට එහි ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කරන ලදී. අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය අදියර වශයෙන් වැඩි කිරීම සඳහා 2019 ජනවාරි 01 වන දින බැංකු අංශය විසින් බාසල් III ප්‍රාග්ධන අදියර සැලැස්ම සාර්ථකව නිම කරන ලදී. සමහර බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් පවතින දිගුකාලීන ගැටලු විසඳීමට තීරණාත්මක පියවර ගන්නා ලදී. එම ආයතනවල අවදානම්, මූල්‍ය පද්ධතියේ අනෙකුත් අංශ වෙත ගලායෑම වළක්වන ලදී.

මූල්‍ය අංශය සම්බන්ධව, තම අවදානම් කළමනාකරණ පද්ධති සහ විශ්ලේෂණ මෙවලම් වැඩිදියුණු කරගැනීමට සමස්ත මූල්‍ය අංශයේම ආයතන දිරිමත් කරන ලදී. ක්ෂුද්‍ර හා සාර්ව විචක්ෂණශීලී රෙගුලාසි ගෝලීය සම්මත භාවිතයන් හා අනුකූල වන බවට සහතික කර ගැනීමට, ඒවායෙහි විශ්ලේෂණාත්මක හා අධීක්ෂණ ක්‍රමවේද සඳහා වැඩිදියුණු කිරීම් කිහිපයක් මහ බැංකුව විසින් සිදු කරන ලදී. අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයන් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී පූර්වාරක්ෂණ පියවර ගැනීමේ දැක්ම සහිතව ඉහළ අවදානම් සහිත මූල්‍ය ආයතන හඳුනා ගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීම ඒ අතර වේ.

තිරසාර මූල්‍ය ක්‍රියාමාර්ග ද විශාල ප්‍රගතියක් ලබා ඇත. ශ්‍රී ලංකාවෙහි දේශගුණික වෙනස්කම්වලට ඇති අවදානම මෙන්ම පරිසර හිතකාමී මූල්‍ය අවස්ථා ලබාගැනීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රියාමාර්ග ප්‍රචලිත වෙමින් පවතින අතර, 2019 අප්‍රේල් මාසයේදී 'තිරසාර මූල්‍ය පිළිබඳ පෙර දැක්ම' සකස් කිරීම හා දියත් කිරීම මෙහිලා ප්‍රධාන සන්ධිස්ථානයක් විය.

2019 වසරේදී මහ බැංකුව නවීන තාක්ෂණය හරහා ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට තවදුරටත් පියවර ගත්තේය. ඩිජිටල් ගෙවීම් හා පියවීම් පිළිබඳ නව්‍යකරණ පද්ධති භාවිතය වර්ධනය කිරීම සඳහා මූල්‍ය ආයතන සහ මහ බැංකුව දැනටමත් සැලකිය යුතු ලෙස ආයෝජනය කර ඇත. ගෙවීම් සඳහා මෙම වඩාත් කාර්යක්ෂම ක්‍රමවේද මහජනතාව වැඩි වශයෙන් භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තාක්ෂණික දියුණුව හා මහජන දැනුම්වත්භාවය මූල්‍ය අන්තර්ගතභාවයෙහි පවතින හිඩැස් පියවීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ඉලෙක්ට්‍රොනික ගෙවීම් සඳහා ඇති රුචිකත්වය වර්ධනය වුවද, මුදල් භාවිතය ආර්ථිකයෙහි ප්‍රධාන අංගයක් ලෙස පැවතුණු අතර එය ඉදිරියේදීත් එසේ පවතිනු ඇත. ඒ අනුව, මහ බැංකුව විසින් ව්‍යවහාර මුදල් කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. මූල්‍ය ආයතනවල සහ මහජනතාවගේ සහය ඇතිව, පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

හරහා සංසරණය වන මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය සුරැකීමට අප සමත් වී ඇත.

විචක්ෂණශීලී මට්ටමක අවදානමක් දරමින් රජයේ මූල්‍ය අවශ්‍යතා හැකි අවම පිරිවැයක් යටතේ සපුරා ගැනීම සහතික කරමින් රාජ්‍ය ණය කළමනාකරණය කාර්යක්ෂමව සිදු කරන ලදී. ණය තිරසාර මට්ටමක පවත්වාගෙන යැමට කටයුතු කරන ලදී. පදනම් විරහිත අහිතකර අනුමාන හා විවේචන නොතකා 2019 වසරේදී රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් වගකීම් නිසිකලට සාර්ථකව පියවීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව සක්‍රියව පියවර ගැනීමට මහ බැංකුව  සමත් විය.

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි ඇතැම් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු හඳුනා ගෙන දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ පාරදෘශ්‍යභාවය වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ නිකුත් කර ඇති වර්තමාන විදේශ විනිමය රෙගුලාසි, නියෝග සහ විධාන මහ බැංකුව විසින් නැවත සලකා බලන ලදී.

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලෙහි භාරකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඵලදායී ලෙස සේවක අර්ථසාධක අරමුදලෙහි කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. 2019 වසර තුළදී, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය සහ අනුමත ආයෝජන මාර්ගෝපදේශ පිළිපදිමින් රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සහ කොටස් වෙළඳපොළෙහි ආයෝජන ක්‍රියාකාරකම් නැවත අරඹන ලදී.

සර්ව සහභාගීත්වයකින් යුතු හා තුලිත ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සහ රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2019 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව සිය සංවර්ධන මූල්‍ය හා ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සහනදායී ණය මෙහෙයුම් සමඟ අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි (International Financial Corporation) තාක්ෂණික හා මූල්‍ය ආධාර

ඇතිව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගික සැලසුම (National Financial Inclusion Strategy) සකස් කිරීමෙහිලා ද ප්‍රගතියක් ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දරන ලද සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස, 2019 ඔක්තෝබර් මාසයේදී, මූල්‍ය කාර්ය සාධක බලකාය, ස්වකීය "අළු ලැයිස්තුවෙන්" (FATF Grey List) ශ්‍රී ලංකාව ඉවත් කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය කාර්ය සාධක බලකායෙහි නිර්දේශවලට අනුකූලව අඛණ්ඩව කටයුතු කළ අතර, විදේශීය හවුල්කරුවන් සහ දේශීය නියෝජිත ආයතන කිහිපයක් සමඟ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම පුළුල් කරන ලදී.

අභියෝගාත්මක ගෝලීය හා දේශීය පරිසරයක් තුළ වුවද, ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය දිරි ගැන්වීම හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව සිය අරමුණු වන ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් විශාල ජයග්‍රහණයක් ලබා ඇත. ඉදිරියේදී, නව රජයේ දර්ශනයට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාධාරණ සහ සාර්ව සහභාගීත්වයකින් යුතුව රටෙහි මූර්ත අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය තුළින් ඉහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක් ලෙස ඉදිරියට ගමන් කිරීම සඳහා ආර්ථිකය වෙත අඛණ්ඩ දායකත්වයක් සපයනු ඇත.

පසුගිය වසර කිහිපය තුළ සිදු වූ වර්ධනයන් මගින් පෙන්නුම් කෙරෙන පරිදි, ඇතැම් අවස්ථාවල සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ආර්ථික වර්ධනය අතර තුලනයේ යම් පරස්පරතාවයක් සිදු වී ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකාව සිය ආර්ථිකය සීඝ්‍ර ඉහළ මාවතක් වෙත යොමු වීමට (උඩ්ඩායනය) සූදානම් වන අවස්ථාවක ස්ථාවරත්වය වැදගත් වන අතර, ජනතා කේන්ද්‍රීය රජයකට එහි සමාජීය හා මානව සංවර්ධන අරමුණු නොසලකා හැරිය නොහැකිය. ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව වෙතද නිසි අවධානය යොමු කරමින් රාජ්‍ය ප්‍රතිපත්තියේ අරමුණු අතර ඇති විය හැකි යම් පරස්පරතාවයන් තුලනය කිරීම සඳහා විසඳුම් සෙවීමේ අපගේ උත්සාහයන් ඉදිරියට ගෙන යෑමට අපි අදහස් කරමු.

මෙම පසුබිම තුළ, ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට තම ඉදිරි ප්‍රතිපත්ති සැලසුම් සකස් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මැදිකාලීනව සපුරාගැනීමට අපේක්ෂිත පුළුල් ප්‍රතිපත්ති රාමුව මෙම පෙර දැක්ම තුළින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව, 2020 ප්‍රතිපත්ති පෙර දැක්ම පහත මාතෘකා යටතේ පෙළගැස්වේ:

| | | |
|---|---|---|
| 2 වන කොටස | : | 2020 වසර සහ ඉදිරිය සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ප්‍රතිපත්ති |
| 3 වන කොටස | : | 2020 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය සඳහා අදාළ වන මහ බැංකු ප්‍රතිපත්ති |
| 4 වන කොටස | : | මහ බැංකුවේ සහායක සහ නියෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රතිපත්ති |

## 2. 2020 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ග සහ ප්‍රතිපත්ති

දේශීය සහ ගෝලීය අංශයෙහි විවිධ අභියෝගතා මධ්‍යයේ වුව ද, මැදිකාලීනව උද්ධමනය අඩු හා ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සහ උද්ධමන අපේක්ෂා එවැනි මට්ටමක රඳවා ගැනීම සඳහා දත්ත සහ කරුණු මත පදනම් වූ ප්‍රවේශයක් ඔස්සේ ඉදිරි දැක්මකින් යුතුව මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය. තිරසාර ඉහළ වර්ධන ගමන් මගක් වෙත නැවත යොමුවීම සඳහා මෙම කරුණු ආර්ථිකයට අවශ්‍ය තත්ත්වයන් වේ.

භූ දේශපාලනික සහ ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ පීඩන තත්ත්වයන් ඉහළ යෑම, ගෝලීය ආර්ථික වර්ධනය සමස්තයක් ලෙස මන්දගාමී වීම මෙන්ම, උද්ධමනය හා උද්ධමනයෙහි ඉදිරි දැක්ම පහළ මට්ටමක පැවතීම යනාදී අවහිරතා රැසක් සැලකිල්ලට ගෙන ඇමෙරිකා එක්සත් ජනපද සංචිත බැංකුව 2019 වසරේ දී ප්‍රතිපත්ති අනුපාතික පහත දැමීම අනුව යමින් දියුණු ආර්ථික ගණනාවක්ම සිය මුදල් ප්‍රතිපත්ති ලිහිල් කරන ලදී. නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මහ බැංකු බහුතරයක් විසින් ද වසර තුළ දී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වඩාත් ලිහිල් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව ද පෙර වසරේ දී වැඩි කාලයක් තුළ පවත්වා ගෙන ගිය මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් කරමින් 2019 වසරේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් වෙත යොමු විය. 2019 වසරේ අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික අනාගතයේ දී පහත දැමීමේ හැකියාව පිළිබඳ ඉදිරි මාර්ගෝපදේශයක් වෙළඳපොළ වෙත ලබා දෙන ලදී. ඉන්පසුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතික (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) යන ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික 2019 මැයි මාසයේදී පදනම් අංක 50 කින් අඩු කරන ලද අතර නැවතත් 2019 අගෝස්තු මාසයේදී පදනම් අංක 50 කින් පහත දමන ලදී.

මේ අතර, 2018 වසරේ සැප්තැම්බර් මස මැද භාගයේ සිට දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති ඉහළ සහ අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය මඟ හරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය භාවිතා කළේය. ඒ අනුව, වාණිජ බැංකු වෙතැති රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2018 නොවැම්බර් මාසයේ දී සහ 2019 මාර්තු මාසයේ දී සමස්තයක් ලෙස ප්‍රතිශතාංක 2.50 කින් පහත දමන ලදී. මෙමඟින් දේශීය මුදල් වෙළඳපොළ වෙත සැලකිය යුතු ද්‍රවශීලතාවක් මුදා හැරුණු අතර, 2019 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට අතිරික්ත ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට උපකාරී විය.

එම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අමතරව, නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් ද හඳුන්වා දෙන ලදී. මෑතකාලීනව ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම වෙළඳපොළ ණය පොලී අනුපාතික වෙත ඉහළ කාර්යක්ෂමතාවයකින් සම්ප්‍රේෂණය කිරීම මෙයින් අපේක්ෂිතය. 2019 වසරේ අප්‍රේල් මාසයේ දී තැන්පතු පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී. වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යෑම හේතුවෙන් සැප්තැම්බර් මාසයේ දී වාණිජ බැංකුවල තැන්පතු අනුපාතික මත පනවන ලද උපරිම සීමා ඉවත් කරන ලද අතර, ඒ වෙනුවට ණය පොලී අනුපාතික මත උපරිම සීමා හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල සැලකිය යුතු පහළ යෑමක් සිදු විය. 2020 වසර තුළ දී වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, මේ වන විටත් ප්‍රකාශයට පත් කර ඇති පරිදි 2020 වසරේ මාර්තු මාසයේ දී ණය පොලී අනුපාතික මත පනවන ලද උපරිම සීමා පිළිබඳව මහ බැංකුව සමාලෝචනයක් සිදු කරනු ඇත.

මෙම පියවරයන් පෞද්ගලික අංශය වෙත ගලා යන ණය ප්‍රමාණය නැවත ඉහළ නැංවීමට උපකාරී විය. නමුත් 2019 වසරේදී ණය වර්ධනය අපේක්ෂා කළ මට්ටමට සාපේක්ෂව පහළ මට්ටමක පැවතිණි. බලාපොරොත්තු වන අන්දමට ණය අනුපාතික තවදුරටත් පහළ යෑම සහ ආයෝජකයින්ගේ විශ්වාසයේ අපේක්ෂිත වැඩිදියුණු වීමත් සමඟ ඉදිරියේදී ණය සහ මුදල් සැපයුමේ වර්ධනයෙහි ඉහළ යෑමක් සිදුවනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි.

2020 වසර අවසන් වන විට පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වර්ධනය සියයට 12-13 ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. එය ආර්ථික ක්‍රියාකාරකම් යළි නඟාසිටුවීම සඳහා ප්‍රමාණවත් වනු ඇත. පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි අපේක්ෂිත වර්ධනය හේතුවෙන් 2020 වසර අවසානය වන විට පුළුල් මුදල් සැපයුමේ වර්ධනය සියයට 14 ක පමණ මට්ටමකට ළඟාවනු ඇත. උද්ධමනයට අහිතකර බලපෑම් ඇති කරමින් අධික ඉල්ලුම් පීඩනයක් ඇති කිරීමට මෙය හේතු නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරියේදී පාරදෘශ්‍ය, සංගත සහ වගවීමකින් යුතු මුදල් ප්‍රතිපත්ති රාමුවක් තුළින් උද්ධමනය සියයට 4-6 අතර පරාසයක පවත්වා ගැනීම සඳහා වූ අපගේ කැපවීම ඉදිරියටත් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරමු. උද්ධමනය ස්ථාවර මටට්මක පවත්වා ගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධිය වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව රාජ්‍ය මූල්‍ය අධිකාරීන් සමඟ සංවාදය අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. ජාත්‍යන්තරව පිළිගත් පරිචයන්ට අනුරූප වන පරිදි මුදල් නීති පනත සඳහා සංශෝධන සිදුකිරීමට ද අපේක්ෂා කෙරේ. මහ බැංකු යහපාලනය වැඩිදියුණු කිරිම, එහි ස්වාධීනත්වය, විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම මෙන්ම මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම යනාදී සියල්ල එහිදී අතිශයින් අවශ්‍ය කෙරෙන සාධක වේ. ඒ අතරම, මූල්‍ය පද්ධති ස්ථායීතාව තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශයේ අධීක්ෂණය සහ සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම ද කළ යුතුව ඇත.

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව අභ්‍යන්තර ආයතනික සැකැස්ම වැඩිදියුණු කිරීම මෙන්ම, මහ බැංකුවේ තාක්ෂණික හා ආයතනික ශක්‍යතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත. අංග සම්පූර්ණ, සාර්ව ආර්ථික ආකෘති පදනම් කරගත් පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (FPAS) යටතේ ලබාගන්නා ලද සාර්ව ආර්ථික පුරෝකථනයන්හි සහාය ඇතිව මහ බැංකුව පසුගිය වසර කිහිපය තුළ දී වඩාත් ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කළේය. මහ බැංකුවේ තාක්ෂණික හා ආයතනික හැකියාව ශක්තිමත් කිරීම තවදුරටත් ප්‍රමුඛතාවක් ලෙස සලකනු ලබන අතර, ශ්‍රී

ලංකාවේ කාලයක් මුළුල්ලේ පවතින සංවර්ධන අභියෝගවලට සරිලන පරිදි ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා විකල්ප ක්‍රමවේදයන් හඳුනා ගැනීමට මහ බැංකු කාර්ය මණ්ඩලය දිරිමත් කෙරෙනු ඇත. ඉදිරි දැක්මකින් යුතු දර්ශක සහ සමීක්ෂණවල විෂය පථය සහ ආවරණය තවදුරටත් පුළුල් කෙරෙනු ඇත. මෙම ක්‍රියාමාර්ග අතර උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ (IES) ආවරණය කොළඹ දිස්ත්‍රික්කය ඉක්මවා ජාතික මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමට  සැලසුම් ඇතුළත් වේ. මෙමගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩා ඵලදායී තොරතුරු ලබාදෙනු ඇත.

කෙසේ වෙතත්, ආහාර මිල ගණන් සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් වෙනස් වීම කෙටිකාලයේ දී උද්ධමන උච්චාවචනයන්ට හේතු වන අතර,  එමගින් පෙන්නුම් කරනු ලබන්නේ මූර්ත ආර්ථික තත්ත්වයේ වර්ධනය මෙන්ම සුදුසු මුදල් ප්‍රතිපත්ති මත දිගුකාලයේ දී මිල ස්ථායිතාව රඳා පවතින බවයි. වර්තමානයේ දක්නට ලැබෙන පහළ උද්ධමනකාරී පරිසරය, මන්දගාමීව පවතින ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය මෙන්ම මුදල් ප්‍රතිපත්ති මගින් සානුබල සැපයීම සඳහා යම් අවකාශයක් සලසා ඇත. ඉදිරි වසරවල දී, ශ්‍රී ලංකාව ඉහළ වර්ධන මාවතක් කරා ගමන් ගැනීමේ දී, ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ මට්ටමක රඳවා ගැනීමට හිතකර පදනමක් ඇති කරන මිල ස්ථායීතාව පවත්වා ගෙන යෑම සඳහා මුදල් සහ රාජ්‍ය මූල්‍ය  ප්‍රතිපත්ති අතර සමීප සම්බන්ධීකරණයක් අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම තුළ, නිෂ්පාදන ආර්ථිකයේ තිරසාර දියුණුවක් සහතික කිරීම සහ ඵලදායී සේවා නියුක්ති අවස්ථා උත්පාදනය ඇති කිරීම සඳහා මහ බැංකුව, රජය සහ වෙනත් රාජ්‍ය අධිකාරීන් සමඟ සමීපව කටයුතු කරනු ඇත. අඩු හා ස්ථාවර මට්ටමේ උද්ධමනයක් සහතික කිරීම සඳහා පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව ඉල්ලුම් තත්ත්වවල වෙනස්වීම් අධීක්ෂණය බෙහෙවින් සිදු කෙරෙනු ඇත.

අතීතයේදී මෙන්,  මිල ස්ථායීතාව මෙන්ම සාර්ව ආර්ථික ස්ථායීතාව තිරසාරව පවත්වා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව වැඩිදියුණු කිරීමට මහ බැංකුව රාජ්‍ය මූල්‍ය අධිකාරීන් සමඟ එක්ව අඛණ්ඩව කටයුතු කරනු ඇත. රජයේ වියදම් තාර්කීකරණය කිරීමට සහ ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනයක් තුළින් රජයේ ආදායම ඉහළ

නංවාගැනීමට රජය තවදුරටත් පියවර ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. අවශ්‍ය ප්‍රතිසංස්කරණ තුළින් බදු පදනම පුළුල් කිරීමත්, බදු පරිපාලනය සහ අනුකූලතාවය වැඩිදියුණු කිරීමත් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තුළින් රජය සතු වෙළඳ ව්‍යවසායයන් ශක්තිමත් කිරීම රජයේ ආදායම් ඉහළ නැංවීමට සහ එවැනි ආයතන පවත්වාගෙන යෑම සඳහා වන රාජ්‍ය මූල්‍ය පීඩනය අඩු කර ගැනීමට හැකි වනු ඇති අතර එමගින් මහජනතාවට සහ ව්‍යාපාරික ප්‍රජාවට වඩා හොඳ සේවා සැපයුමක් සහතික වනු ඇත. මේ සම්බන්ධයෙන් රජය සතු ව්‍යාපාර ආයතන කළමනාකරණය කිරීමට විධිමත් ක්‍රියාවලියක් තුළ වෘත්තිකයන් පත් කිරීම හරහා එවැනි ආයතනවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට අඛණ්ඩව ගනු ලබන උත්සාහයන් අප පිළිගනිමු.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, දේශීය මුදල් වෙළෙඳපොළෙහි ද්‍රවශීලීතාව කළමනාකරණය කිරීම සඳහා භාවිතා කෙරෙන ප්‍රධානම ප්‍රතිපත්ති උපකරණය ලෙස සක්‍රිය විවට වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු තවදුරටත් භාවිතා කරනු ඇත. කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ අපේක්ෂිත මට්ටමක පවත්වා ගැනීමට මෙහෙයවනු ඇත. දේශීය මුදල් වෙළඳපොළ සුමට ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත. ඉදිරියේ දී දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රමාණවත් ද්‍රවශීලීතාවක් පැවතීම සහතික කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.

මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාව වටහාගෙන ඇත. පවත්නා පදනම් පොලී අනුපාතිකවල ඌනතා හේතුවෙන් මුදලේ සැබෑ පිරිවැය පිළිබිඹු කරන යෝග්‍ය පදනම් පොලී අනුපාතිකයක් බැංකු අංශය සඳහා ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යව තිබේ. ණය උපකරණ සඳහා මිල නියම කිරීමට සුදුසු පිරිවැය පිළිබිඹු වන පදනම් පොලී අනුපාතිකයක් හඳුන්වාදීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව කාර්ය සාධක බලකායක් පිහිටුවීමට මහ බැංකුව අදහස් කරයි. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීමට සහාය වන අතරම, මෙම

පියවර මගින් බැංකු අතර යහපත් තරගකාරිත්වය වැඩිදියුණු වනු ඇතැයි අපි විශ්වාස කරමු.

අපේක්ෂිත අඩු උද්ධමන පරිසරයට අනුකූලව, දේශීය ආර්ථික ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා මැදි කාලීනව සැලකිය යුතු අන්දමේ පහළ නාමික පොලී අනුපාතික පවත්වා ගැනීම සහතික කිරීමට අපි අපේක්ෂා කරමු. කෙසේ වෙතත්, මෙම අඩු නාමික පොලී අනුපාතික, ස්ථාවර ආදායම් උපයන්නන්ට, විශේෂයෙන්ම ජනගහනය ශීඝ්‍රයෙන් වයස්ගත වන මෙම සමාජය තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට බලපෑමක් ඇති කරන බව අප විසින් තේරුම් ගෙන ඇත. මේ සම්බන්ධයෙන්, ජනගහනයෙන් එවැනි බලපෑම්වලට ලක් වූ කොටස්වල අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව මූල්‍ය උපකරණ වැඩිදියුණු කිරීමට බැංකු හා වෙනත් මූල්‍ය ආයතන දිරිමත් කරමු.

අප අතීතයේ දී අවධාරණය කර ඇති පරිදි වෙළඳපොළ බලවේග මත පදනම්ව වඩා ඉහළ නම්‍යශිලීතාවයකින් යුතුව විනිමය අනුපාතිකය තීරණය වීම සඳහා මහ බැංකුව විසින් අඛණ්ඩව කටයුතු කරනු ඇති අතර, විනිමය අනුපාතිකයට අපේක්ෂිත මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ කම්පන අවශෝෂකයක් (shock absorber) ලෙස ක්‍රියා කිරීමට ඉඩදෙනු ඇත. ඒ අනුව, දේශීය විදේශීය විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම, විනිමය අනුපාතිකයේ ඇතිවන අධික විචලනයන් පාලනය කිරීම සඳහා පමණක් සීමා වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීරණ ණය පහසුකම අඛණ්ඩව පවත්වාගෙන යෑම මැදි කාලීනව විදේශීය අංශයේ ස්ථාවරභාවය සඳහා උපකාරී වනු ඇත. කෙසේ වෙතත්, විදේශීය අංශයේ තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා, දේශීය නිෂ්පාදනය සහ භාණ්ඩ හා සේවා අපනයනය සහ ණය ගනයට නොවැටෙන විදේශ විනිමය ගලා ඒම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති අවශ්‍ය වේ.

ඉහළ අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ද්විත්ව හිඟ තත්ත්වය වසර ගණනාවක් තිස්සේ පැවතිණි. එබැවින්, දේශීය හා විදේශීය ණය ගැනීම් ස්වාභාවිකවම ණය මට්ටම ඉහළ යෑමට හේතු වී තිබේ. විදේශීය ණය ගැනීම්

විදේශීය ජංගම ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් කිරීමට දායක වේ. මීට අමතරව, විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් බාහිර කම්පනවලට ඔරොත්තුදීමේ හැකියාව සඳහා ඉවහල් වන ජාත්‍යන්තර සංචිත පහළ යයි. එම නිසා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟාකර ගැනීමේ ප්‍රයත්න අඛණ්ඩව සිදු කෙරෙන අතරම, ජාත්‍යන්තර ලෙස වෙළඳාම් කළ හැකි භාණ්ඩ හා සේවා නිපදවන අංශය ශක්තිමත් කිරීම මගින් ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටම්වල පවත්වා ගැනිම වැදගත් වේ.

විදේශ වත්කම් ආයෝජනය සඳහා ආකෘති මත පදනම් වූ උපායමාර්ගික වත්කම් වෙන්කිරීමේ රාමුවක් (strategic asset allocation) තුළින් විදේශීය සංචිත කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. මෙම විෂය ක්ෂේත්‍රය තුළ තවත් බොහෝ දෑ සැලසුම් කර ඇති අතර මහජනතාව සහ විදේශීය ආයෝජකයින් ඇතුළු පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ජාත්‍යතන්තර සුරැකුම්පත් කොමිසමේ (IOSCO) මූලධර්මවලට අනුකූලව දින-මැද පදනම් නිර්දේශ අනුපාතිකයක් (mid-day benchmark reference rate) හඳුන්වා දීමට මහ බැංකුව කටයුතු කරමින් සිටියි. මීට අමතරව, ජාත්‍යන්තර විදේශ විනිමය වෙළඳපොළ සමඟ ගනුදෙනු කිරීමේ දී ඉහළ ප්‍රමිතියකින් යුත් ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර විදේශ විනිමය කේතය ක්‍රියාත්මක කිරීම ද ඉදිරි කාල සීමාව තුළ අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ අඩංගු කරුණුය.

සුදුසු හා කාලෝචිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිගන්නා අතර ම, එවැනි ප්‍රතිපත්ති ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ වැදගත්කම සහ ඒවායේ අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව ද මහ බැංකුව දැනුම්වත් ය. නිසි සන්නිවේදනය මඟින් ජනතාවගේ ආර්ථික හා මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමත්, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා දීමත්, අවිනිශ්චිතතාව අඩු කර ප්‍රතිපත්තිවල විනිවිදභාවය වැඩිදියුණු කිරීමත්, මහ බැංකුව කෙරෙහි විශ්වාසනීයත්වය වැඩි කිරීමත් සිදු වේ. එය පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් මනාව පාලනය කිරීමට උපකාරී වේ. මහ බැංකුව සිය ප්‍රතිපත්ති සන්නිවේදනය කිරීමේ දී වඩාත් ක්‍රියාකාරී සහ විවෘත පිළිවෙතක්

අනුගමනය කරමින් සිටියි. 2020 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය සන්නිවේදන උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරයි.

අතීතයේ දී මෙන්ම, මහ බැංකුව විසින් පූර්ව දින දර්ශනයක් මත පදනම්ව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ප්‍රකාශයට පත්කරනු ඇති අතර 2020 වසර සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රකාශයට පත් කරන දින පහත දැක්වේ.

**2020 වසරේ මුදල් ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කරනු ලබන පූර්ව දින දර්ශනය**

| නිවේදන අංකය | නිවේදන දිනය |
|---|---|
| 1 | ජනවාරි 30, බ්‍රහස්පතින්දා |
| 2 | මාර්තු 05, බ්‍රහස්පතින්දා |
| 3 | අප්‍රේල් 09, බ්‍රහස්පතින්දා |
| 4 | මැයි 21, බ්‍රහස්පතින්දා |
| 5 | ජූලි 09, බ්‍රහස්පතින්දා |
| 6 | අගෝස්තු 20, බ්‍රහස්පතින්දා |
| 7 | ඔක්තෝම්බර් 08, බ්‍රහස්පතින්දා |
| 8 | නොවැම්බර් 26, බ්‍රහස්පතින්දා |

# 3. 2020 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශ ප්‍රතිපත්ති

මහ බැංකුවේ අනිවාර්ය කාර්යභාරයක් වන මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා 2019 වසරේදී අනුගමනය කරනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව මීට පෙර ඉදිරිපත් කරන ලද මගේ ප්‍රකාශන මගින් බොහෝ දුරට විස්තර කෙරුණි. මෙම ක්‍රියාමාර්ග මගින් වෙනස් වන තත්ත්වයන් හා ගැළපෙන, කම්පනවලට ඔරොත්තු දිය හැකි සහ කාර්යක්ෂම ලෙස වර්ධනය වන මූල්‍ය අංශයක් අප විසින් අපේක්ෂා කෙරේ. ඵලදායී නියාමනය සහ අධීක්ෂණය, පුළුල් අවදානම් කළමණාකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ ගෙවීම් හා පියවීම් පද්ධතිය යනාදී සියල්ල මෙම උත්සාහය සඳහා දායක වී ඇත.

2019 වසරේදී බැංකු අංශය මධ්‍යස්ථ වශයෙන් ප්‍රසාරණය විය. අභියෝගාත්මක දේශීය හා ගෝලීය තත්ත්වයන් පැවතියදීත්, නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ මට්ටමකින් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා මට්ටම් පවත්වාගෙන යෑම තුළින් බැංකු අංශයේ පැවති ඔරොත්තු දීමේ හැකියාව නිරූපණය විය. මෙම අංශයෙහි ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, අන්තර්ජාතික නියාමන සහ ප්‍රශස්ත පරිචයන් මත පදනම්ව නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා 2019 වසර තුළදී මහ බැංකුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

ඒ අනුව, මහ බැංකුව විසින් බාසල් III නියාමන රාමුව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ අතර ශ්‍රී ලංකාවේ බැංකු අංශය සඳහා මූල්‍ය උපකරණ පිළිබඳ මූල්‍ය වාර්තාකරණය සඳහා වන 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (Sri Lanka Financial Reporting Standard 9) වෙත යොමුවීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. තවද, 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වෙත යොමු වීමේ අනුකූල බව තහවුරු කිරීමට සහ බාසල් III රාමුව යටතේ ප්‍රාග්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම් ගණනය කිරීමේ අනුකූල බව තහවුරු  කිරීමට, බාසල් III රාමුව යටතේ ඇති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ තෝලන අනුපාතය ගණනය කිරීම නව ගිණුම්කරණ ප්‍රමිතියට (SLFRS 9) අනුගත

කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ සටහන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. එමෙන්ම, බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් හෙළිදරව් කිරීමේ ප්‍රකාශන නව මාර්ගෝපදේශවලට අනුකූලව ඉදිරිපත් කිරීම සඳහා, නව ආකෘති හඳුන්වා දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. බැංකු ක්ෂේත්‍රයේ සිදු කරන ලද වෙනස්කම්, ගණකාධිකරණ සහ විගණන වෘත්තීය ක්ෂේත්‍රයන්හි සිදු කරන ලද වෙනස්කම් සහ බාසල් III රාමුව සහ 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හඳුන්වා දීම හා සමගාමීව බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය ප්‍රකාශනවල ඒකීය බව සහ ගුණාත්මක බව පවත්වාගෙන යෑම සඳහා විගණන නිලධාරීන් තෝරා ගැනීම සඳහා වන සුදුසුකම් නිර්ණායක ශක්තිමත් කරන ලදී. තවද, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් සහ ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු පුළුල් ලෙස ඇගයීම සඳහා සහාය වන රාමුවක් හඳුන්වා දෙන ලදී.

පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරවලින් පසුව සංචාරක කර්මාන්තය නැවත නගා සිටුවීම සඳහා මැදිහත් වීමේ කාලෝචිත අවශ්‍යතාවය පිළිබඳව සලකා බලමින් සහ රජයේ ප්‍රතිපත්තියට අනුගත වෙමින් මහ බැංකුව විසින් සංචාරක කර්මාන්තයට සම්බන්ධ පුද්ගලයින්ට සහ ආයතනවලට බලපත්‍රලාභී බැංකු මගින් සහන සැලසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

තවද, බලපත්‍රලාභී බැංකුවල නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව මහ බැංකුව විසින් නව නියාමන හඳුන්වා දෙන ලදී. තාක්ෂණික ප්‍රවීණත්වයෙන් යුත් යෝග්‍ය සහ කාර්යක්ෂම විදේශ සේවකයන් බලපත්‍රලාභී බැංකුවල සේවයේ යෙදවීම සඳහා විදේශ සේවකයින්ට ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල පත්වීම් ලබා දීමට අදාළ සුදුසුකම් නිර්ණායක දක්වමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මේ අතර, පොලී සහිත ඉතුරුම් සහ කාලීන තැන්පතු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කරන පොලී නොවන දිරිදීමනා ක්‍රම මත මහ බැංකුව විසින් නියෝග නිකුත් කරන ලදී. එමෙන්ම, අන්තර්ජාතික ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සහ භාණ්ඩාගාර මෙහෙයුම්වල විචක්ෂණශීලී බව තහවුරු කිරීම සඳහා නියාමන රාමුවක් හඳුන්වා දෙන ලදී.

බලපත්‍රලාභී බැංකු, ඒවායේ බාහිර විගණකවරුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ මහ බැංකුව පවත්වා ගෙන යන සන්නිවේදනය ශක්තිමත් කළ අතර, රජය සතු කුඩා ප්‍රමාණයේ බැංකු ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා මහ බැංකුව විසින් පහසුකම් සපයන ලදී.

මහ බැංකුව නව බැංකු පනතක් කෙටුම්පත් කිරීම ආරම්භ කළ අතර, 2021 වසරේදී නව පනත බලාත්මක කිරීමට අපේක්ෂා කරයි. යෝජිත පනතේ ප්‍රධාන අංගයන් අතරට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා එකම ආකාරයේ බැංකු බලපත්‍රයක් හඳුන්වාදීම; බැංකුවල විශාලත්වය හා ඒවායෙහි මෙහෙයුම් වල ස්වභාවය යනාදියට අනුකූලව බැංකු නියාමනයන්හි සමානුපාතිකත්වය ඇති කිරීම; විදේශීය බැංකු ශාඛා ශ්‍රී ලංකාව තුළ උපසමාගම් ලෙස ලියාපදිංචි කිරීම සහ ඒවාට බාහිර අහිතකර බලපෑම්වලින් සිදුවන බලපෑමෙන් මුදාලීම (ring-fence); බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක පිහිටුවීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම; පාරිභෝගික ආරක්ෂාව, තැන්පතු රක්ෂණය හා බැංකුවල යහපාලනය ශක්තිමත් කිරීම; අක් වෙරළ බැංකු ඒකකයේ සහ දේශීය බැංකු ඒකකයේ මෙහෙයුම් එකම ව්‍යාපාරයක් බවට ඒකාබද්ධ කිරීම; සහ නිරාකරණය, බලාත්මක කිරීම හා අධීක්ෂණ කටයුතු ඇතුළත් වේ. තවද, නව බැංකු පනත මගින් කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමට නියමිත බැංකු සඳහා රෙගුලාසි ඇතුළත් වේ.

ශක්තිමත් හා සක්‍රීය බැංකු අංශයක් ඇති කිරීමේ අදහසින්, 2020 වසර අවසානය වන විට බැංකු සඳහා වැඩි දියුණු කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාග්ධනය යෙදවීමත් සමඟ ප්‍රාග්ධන අනුපාත වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බැංකු අංශය නියාමනය කරන ආයතනය වශයෙන්, බාහිර කම්පන සඳහා බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව හා අර්බුදවලට කල්තියා සූදානම් වීම තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය බව අප තේරුම් ගෙන ඇත. ඒ අනුව, ගැටලුකාරී බැංකුවලට සිදුවන අහිතකර බලපෑම සහ එමගින් මූල්‍ය පද්ධතියට සිදුවිය හැකි පැතිරයෑමේ බලපෑම අවම කිරීම සඳහා බැංකු විසින් ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය. තවද, ගිණුම්කරණ ප්‍රමිති හා බැංකු පනතේ විධාන සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම අවශ්‍ය පරිදි

සිදුකෙරේ. එමගින් ජාත්‍යන්තර නියාමන ප්‍රමිතීන් සහ ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ වෙනත් අවදානම් පිළිබඳ විචක්ෂණ අවශ්‍යතා ශක්තිමත් කිරීම තවදුරටත් තහවුරු වේ.

තාක්ෂණික අවදානම්වලට ඔරොත්තු දීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා ප්‍රශස්ත පරිචයන්ට අනුගතව තොරතුරු තාක්ෂණය සහ බැංකුවල ආරක්ෂාව සම්බන්ධයෙන් නියාමන සහ අධීක්ෂණ රාමුවට වෙනස්කම් හඳුන්වා දෙනු ලැබේ. යෝජිත රෙගුලාසි මගින් බැංකුවලට ඔවුන්ගේ තොරතුරු පද්ධති සහ ඒ ආශ්‍රිත තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කිරීමට හා ශක්තිමත් කිරීමට පෙළඹවීමක් ඇති කෙරෙන අතර එමඟින් අවදානම් කළමනාකරණය වැඩිදියුණු කරනු ලබයි.

බැංකු නොවන තැන්පතු භාරගැනීමේ මූල්‍ය ආයතන වෙත අපි දැන් යොමු වෙමු. බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් සැලකූ විට, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මන්දගාමී ක්‍රියාකාරිත්වය 2019 වසර තුළදී අඛණ්ඩව පැවතුණි. ඍණාත්මක ණය වර්ධනය, ලාභදායීත්වය පහත වැටීම සහ අක්‍රීය ණය වල ඉහළ යෑම මෙම අංශයේ ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරය සහ ජනාධිපතිවරණයට පෙර පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් මන්දගාමී වූ ආර්ථික වර්ධනය සහ වෙළඳ කටයුතු මෙම අයහපත් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

ප්‍රතිපත්තිමය වශයෙන් ගත්කල, ආර්ථික වර්ධනය නැවත නංවාලීම අරමුණු කරගත් රජයේ ප්‍රතිපත්ති හා සමගාමීව බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට විවිධ උපදෙස් නිකුත් කළෙමු. බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් විසින් සිදුකරනු ලබන ඇපකර තැන්පතු හැර වෙනත් තැන්පතු භාරගැනීම සීමාකිරීම සඳහා 'තැන්පතු' මත සහ අධික පොලී අනුපාතිකවලින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමේ අරමුණ ඇතිව ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා වන උපරිම පොලී අනුපාතික මත විධානයන් බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වෙත නිකුත් කරන ලදී. මූර්ත ආර්ථිකයට සිදුවන ණය ප්‍රවාහ වැඩිදියුණු කිරීම පිණිස තැන්පතු සහ ණය උපකරණ සඳහා උපරිම පොලී අනුපාත පිළිබඳ නියෝගයක් බලපත්‍රලාභී මූල්‍ය ආයතනවලට ද නිකුත් කළෙමු.

මුදල් සමාගමක් ගණන් බේරා ඇවර කිරීමේදී හිමිකම් පෑමේ ප්‍රමුඛතාවය පිළිබඳ මඟපෙන්වීමක් ලබාදීමේ අරමුණින් මුදල් ව්‍යාපාරවලට අදාළ රෙගුලාසියක් නිකුත් කරන ලදී. 2019 වසරේ අයවැයට අනුව ණය සහ වටිනාකම අතර අනුපාතය (loan-to-value) පිළිබඳ විධානය සංශෝධනය කරන ලදී. සහන ලබාගැනීමට කැමති සංචාරක ක්ෂේත්‍රයේ පුද්ගලයින්ට හා ආයතනවලට සහන ලබාදීමට බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත විශේෂිත කල්බදු මූල්‍ය සමාගම්වලට අදාළව සංචාරක කර්මාන්තයට ලබාදෙන සහන මැයෙන් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. තවද, ආයතනික යහපාලනය හා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වලට අදාළව හිමිකාරීත්ව සීමාවක් හඳුන්වා දෙමින් උපදේශන පත්‍රිකාවක් නිකුත් කරන ලදී. මීට අමතරව, මුදල් ණයට දීම් සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ණය නියාමන අධිකාරී පනතේ පළමු කෙටුම්පත මුදල් අමාත්‍යාංශය හා එක්ව සකස් කරන ලද අතර එය අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් දැක්වීම සඳහා ලබාගත හැක.

තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම පිණිස, දැඩි නියාමන ක්‍රියාමාර්ගවලට යටත් වන බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් අනාවරණය කිරීම, බලපත්‍ර අවලංගු කිරීම හා කළමනාකරණ මණ්ඩල පත් කිරීම ඇතුළු අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග, පීඩාවට පත් සහ ඉහළ අවදානම් සහිත මුදල් සමාගම්වලට එරෙහිව, අඛණ්ඩව 2019 වසර තුළදී සිදුකරන ලදී. සමාගම්වල වැරදි ක්‍රියාකාරීත්වයන් නිසා ඒවාට සිදුවූ පාඩු පියවා ගැනීම සඳහා ඊට අදාළ වැරදිකරුවන්ට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර පීඩාවට පත් මුදල් සමාගම් දෙකක තැන්පතු ආපසු ගෙවීමට පහසුකම් සපයන ලදී.

ඉදිරියට, මූල්‍ය ව්‍යාපාර පනතේ යෝජිත වෙනස්කම් සහිතව මධ්‍යකාලීනව මෙම අංශයේ ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් කිරීමට අපි අපේක්ෂා කරමු. පීඩාවට පත් මුදල් සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණ ඇතිව ඒවායේ ආයෝජනය කරන ආයෝජකයින් සඳහා හිමිකාරීත්ව සීමා පිළිබඳ නම්‍යශීලී බවක් සහිතව අදාළ ආයතන ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ කාලසීමාවක් ලබාදෙමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන හිමිකාරීත්ව සීමා පිළිබඳ විධාන නිකුත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මූල්‍ය

ව්‍යාපාර පවත්වාගෙන යෑමේදී අවශ්‍ය ශක්තිමත් ආයතනික යහපාලන ක්‍රියාවලීන් හා භාවිතයන්හි වැදගත්කම මෙන්ම මෙම අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඵලදායී ක්‍රියාකාරිත්වය හා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ ප්‍රමිති සකස් කරමින් සංශෝධිත විධාන නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. මේ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම්වල අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා එම සමාගම් ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වීම සඳහා දිරිමත් කරනු ලැබේ. එසේම, නියාමන අවශ්‍යතා සිදුකිරීමට ඇති බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් අනාගතයේදී හෙළිකරනු ඇත.

බැංකු නොවන මූල්‍ය අංශය සඳහා වන මධ්‍යකාලීන ප්‍රමුඛතා අතර වර්තමාන වෙළඳපොළ තත්ත්වයන් හා ප්‍රශස්ත ජාත්‍යන්තර පරිචයන්ට අනුකූලව පවත්නා නියාමන රාමුව ශක්තිමත් කිරීම, ඔරොත්තු දීමේ හැකියාව ඇති වඩා හොඳ කාර්ය සාධනයක් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් ස්ථාපිත කිරීම, දැනට පීඩාවට පත්වී ඇති ඉහළ අවදානම් සහිත මුදල් සමාගම්වල අර්බුද නිරාකරණය කිරීම, වැරදි සිදුකරන්නන් සඳහා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම  යනාදිය ප්‍රධාන වේ.

සියලුම මූල්‍ය ආයතන සඳහා වන නිරාකරණ රාමුව සහ ආරක්ෂණ ජාල යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මහ බැංකුව විසින් හඳුනාගෙන ඇත. මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන සියලුම මූල්‍ය ආයතන ආවරණය වන පරිදි පුළුල් නිරාකරණ රාමුවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියෙහි අපි නිරතව සිටිමු. අර්බුදයට ලක්වූ සහ ඉහළ අවදානමක් සහිත සමාගම්වල ගැටලු විසඳීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට අමතරව බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයක්ද යෝජිත නිරාකරණ රාමුවෙහි අන්තර්ගත වේ. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතනවල රක්ෂණය කරන ලද තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම් අඛණ්ඩව සිදු කරන අතර, තැන්පතු රක්ෂණ ඒකකයට තැන්පතුකරුවන්ගේ දත්ත ලබා ගැනීම සඳහා පුළුල් දත්ත හුවමාරු පද්ධතියක් වැඩිදියුණු කිරීම සහ වන්දි ගෙවීම් යාන්ත්‍රණයෙහි ඵලදායී බව ඉහළ නැංවීම ආරම්භ කර ඇත. එමෙන්ම, අනවසර මූල්‍ය ක්‍රියාකාරකම්වල නියැලීමේ ප්‍රතිඵල සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුම්වත් බව ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග

ගන්නා අතරම මහ බැංකුව විසින් තැන්පතු භාර ගන්නා අනවසර ආයතන සහ තහනම් යෝජනා ක්‍රමවලට එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2019 වසර තුළදී, අප විසින් නව තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඉහළ අවධානයක් යොමු කළ අතර වර්ධනය වන මූල්‍ය අවශ්‍යතා සඳහා සරිලන අයුරින් කාර්යක්ෂම සහ ස්ථාවර ගෙවීම් සහ පියවීම් පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2019 වසරේ ජුනි මාසයේදී විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Point-of-Sale Switch) සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. ජාතික ගෙවීම් කවුන්සිලය 2020-2022 සඳහා වන පෙර දැක්ම අවසන් කරන ලදී. බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය පිළිබඳව අධ්‍යනය කිරීමට ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී. තවත් පියවරක් වනුයේ, 'LankaQR' නමින් ජාතික QR කේත නාමාවලිය නිකුත් කිරීමයි. පාරිභෝගිකයන්ට පහසුකම් සැලසීම සඳහා, වෙළෙඳාම් සිදු කරන පාර්ශවයන්ගේ ගනුදෙනු පියවීම් කාර්යක්ෂම ලෙස නිරවුල් කිරීම සඳහාත් මූල්‍ය ආයතන තුනකට ගෙවීම් කාඩ්පත් සම්බන්ධයෙන් සේවා සපයන්නන් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ අතර, නව ගෙවීම් යාන්ත්‍රණ සම්බන්ධයෙන් මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කළ යෝජනා කිහිපයකට අනුමැතිය ලබා දෙන ලදී.

තවද, පාරිභෝගික අරමුදල්වල ආරක්ෂාව සහතික කිරීම සහ රටේ ගෙවීම් හා පියවීම් පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නංවන අතර නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති කිහිපයක් අනුගමනය කරන ලදී. ව්‍යවහාර මුදල් අවම වශයෙන් භාවිතා කරන සමාජයක් ඇති කිරීම සහ ව්‍යවහාර මුදල් කළමනාකරණයෙහි පිරිවැය අවම කිරීම සඳහා ඩිජිටල් ගෙවුම් යාන්ත්‍රණ තවදුරටත් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි දැනට අවධානය යොමු කර ඇත. නියාමන අවශ්‍යතා උල්ලංඝනය කිරීමේ අවදානමකින් තොරව නවෝත්පාදකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවාවන් පරීක්ෂා කිරීම සඳහා පාලනය කරන ලද පරිසරයක ආරක්ෂිත ඉඩක් ලබාදීම සඳහා මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශයක් ක්‍රියාවට නංවනු ඇත. ඩිජිටල් ගෙවීම් විකල්ප

සහ ප්‍රතිලාභ පිළිබඳව සාමාන්‍ය ජනතාව අතර දැනුම්වත් භාවය වැඩි දියුණු කිරීම තුළින් ඩිජිටල් ගෙවුම් යාන්ත්‍රණ සහ උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරමු.

තවද, අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සැලසුම් කරන අතර රෙගුලාසි සහ මාර්ගෝපදේශනවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවල බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ එතැන් පරීක්ෂණ සහ දුරස්ථ ආවේක්ෂණ කටයුතු සිදු කරන ලදී. ගෙවීම් සහ පියවීම් පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා එවැනි පද්ධති හා සම්බන්ධ අවදානම් සැලකිල්ලට ගනිමින් ගෙවීම් උපකරණ සඳහා නව යෝජනා ඇගයීම සහ වත්මන් පද්ධතියට බලපාන අවදානම් සාධක හඳුනා ගැනීමෙන් එවැනි අවදානම් අවම කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කැමැත්තෙමු.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ දැකිය හැකි ඉහළ යමින් පවත්නා අන්තර් සම්බන්ධතාවය සහ සංකීර්ණ බව හේතුවෙන් සාර්ව විචක්ෂණ ආවේක්ෂණයෙහි වැදගත්කම වැඩිවෙමින් පවතී. එබැවින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයෙහි සිදුවන වෙනස්වීම් සහ තාක්ෂණික වැඩිදියුණු වීම් සමඟ යාවත්කාලීන වීමට සූක්ෂම සහ සාර්ව විචක්ෂණ නියාමනය සඳහා ඇති විශ්ලේෂණාත්මක සහ අධීක්ෂණ ක්‍රම නිරන්තරයෙන් වැඩිදියුණු කරන ලදී.

සාර්ව විචක්ෂණ ආවේක්ෂණ රාමුව ශක්තිමත් කිරීම හා පුළුල් කිරීම සඳහා වැඩි දියුණු කිරීම් කිහිපයක් හඳුන්වා දීමට අපි අදහස් කරමු. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවට කුටුම්භ අංශයෙන් සිදුවන අවදානම් පිළිබඳ විශ්ලේෂණ වැඩි දියුණු කිරීම සඳහා ඒවායේ ණය ගෙවීමට ඇති ශක්‍යතාව පිළිබඳ කුටුම්භ අංශයේ සමීක්ෂණය දිගටම පවත්වාගෙන යන අතර, එය ක්‍රමයෙන් කුටුම්භ අංශය තුළ පුළුල් කෙරෙනු ඇත. තොරතුරුවල පවත්නා අඩුපාඩු සහ බැංකු හා බැංකු නොවන ආයතනවල ආවරණය හඳුනාගැනීම මගින් පවත්නා සාර්ව විචක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට 2020 වසරේදී ප්‍රමුඛත්වයක් ලබාදෙන අතර, සාර්ව විචක්ෂණ දෘෂ්ටිකෝණයෙන් ගත්කල රක්ෂණ අංශයේ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණ කිරීමටද අපි අපේක්ෂා කරමු. අන්තර් නියාමන සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම තුළින් මූල්‍ය පද්ධති ස්ථායිතා ආවේක්ෂණ

යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම ක්‍රියාත්මක කළ යුතු තවත් වැදගත් පියවරක් වේ. ඇතිවිය හැකි සාර්ව මූල්‍ය විචල්‍යතාවන්ට එරෙහිව සාංගමික අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා එම අංශය සඳහා ආතති පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් පුළුල් කිරීමට අපි අපේක්ෂා කරමු. මහ බැංකුවේ නෛතික හා නියාමන රාමුවට අවශ්‍ය සංශෝධන හඳුන්වා දීමෙන් මෙම වැඩි දියුණු කිරීම් සඳහා පහසුකම් සැලසෙනු ඇත.

එලදායී ඒකාබද්ධ අවදානම් පාදක කරගත් සුපරීක්ෂණය වැඩිදියුණු කිරීම අරමුණු කොටගෙන, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ අන්තර් නියාමන සහයෝගීතාවය සහ සහකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අපි කැප වී සිටිමු.

මහ බැංකුව විසින් ගෝලීය සහ දේශීය වර්ධනයන් තුළින් මූල්‍ය අංශයට ඇතිවන අවදානම් අවම කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම, මෑත කාලීන රාජ්‍ය මූල්‍ය සානුබලයන් සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශය නඟා සිටුවීම සඳහා යෝජිත සහන ක්‍රියාමාර්ග වැනි පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු ඉහළ නැංවීමට අනුගමනය කළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ඉදිරි කාලපරිච්ඡේදයේදී මූල්‍ය අංශයේ කාර්යසාධනය ශක්තිමත් කිරීමට අපේක්ෂිතය.

මේ අතර, පවත්නා අවදානම් කළමණාකරණ ප්‍රතිපත්ති සහ අදාළ කමිටුවල ව්‍යූහයන් වැඩිදියුණු කිරීම මගින් 2019 වසරේදී මහ බැංකුව විසින් අවදානම් කළමණාකරණය සඳහා අන්තර්ග්‍රාහී ප්‍රවේශයක් ක්‍රියාත්මක කරන ලදී. මෙය සිදුකරන ලද්දේ මූල්‍ය හා මූල්‍ය නොවන අංශවල හඳුනාගත් ප්‍රධාන අවදානම් මහ බැංකුවේ යෝග්‍ය කළමනාකරණ මට්ටම් සඳහා ඉදිරිපත් කිරීම මගින් කාලෝචිත තීරණ ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණ සහිතවය.

# 4. මහ බැංකුවේ සහායක හා නියෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රතිපත්ති

ආර්ථිකයේ සහ මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට දායක වෙමින්, සමස්ත ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහායක හා නියෝජිත කාර්යයන් රැසක් අඛණ්ඩව ඉටු කරයි.

**ව්‍යවහාර මුදල් කළමනාකරණය**

ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ එකම අධිකාරිය ලෙස මහ බැංකුවේ කාර්යභාරය මෙම ක්ෂේත්‍රය තුළ ඉස්මතු වේ. තාක්ෂණය මත පදනම් වූ මුදල් නොවන ගෙවීම් ක්‍රමවේදවල භාවිතය වැඩිවෙමින් පැවතියද, ආර්ථික කටයුතු පුළුල් වීම හා සමගාමීව ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සඳහා වන ඉල්ලුම ඉහළ යෑම 2019 වසරේදී ද අඛණ්ඩව සිදුවිය. පිරිසිදු ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නෝට්ටු හිතාමතා වෙනස් කිරීම, හානි කිරීම හෝ විකෘති කිරීම සඳහා මුදල් නීති පනත යටතේ සම්පාදනය කර ඇති නෛතික ප්‍රතිපාදන දැඩිව ක්‍රියාත්මක කරන ලදී. ඒ හේතුවෙන් ව්‍යවහාර මුදල් නෝට්ටුවල පිරිසිදුකමෙහි සැලකිය යුතු වැඩිදියුණුවක් දැකිය හැකි විය. ශ්‍රී ලංකා පොලිසියේ ද සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්, පිරිසිදු ව්‍යවහාර මුදල් ප්‍රතිපත්තිය සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හිතාමතා හානි කිරීම වැළැක්වීම පිළිබඳව මහජනතාව, මූල්‍ය ආයතන සහ මුදල් ප්‍රවාහනය කරන සමාගම් දැනුම්වත් කිරීම සඳහා උපකාරී විය.

2020 වසරේ යෙදී ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ 70 වන සංවත්සරය සැමරීම සඳහා රුපියල් 20 ක වටිනාකමින් යුත් සමරු කාසියක් සහ දැනට පවතින 11 වන මුදල් නෝට්ටු මාලාව යටතේ රුපියල් 2,000 ක නව මුදල් නෝට්ටුවක් නිකුත් කිරීමට සැළසුම් කර ඇත. ඒ සමඟම, පවතින 11 වන මුදල් නෝට්ටු මාලාවේ ආරක්ෂණ සළකුණු ද වැඩිදියුණු කෙරෙනු ඇත. විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශ සඳහා අවශ්‍ය කාසි සහ

නෝට්ටු සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාලවල ද සහාය ඇතිව කාසි බෙදා හැරීමේ වැඩසටහන් පැවැත්වීම මගින් කාසි කළමනාකරණය සඳහා යාන්ත්‍රණයක් ඇති කරමින් පවතී. එක් වරකදී විශාල ප්‍රමාණයකට පුළුල් පරාසයක දැනුම සැපයීමට හැකි වන ලෙස ජංගම මුදල් කෞතුකාගාරයෙහි අන්තර්ගතය සහ ගුණාත්මක බව ඉහළ නංවන අතර ම පැරණි කාසි සහ මුදල් නෝට්ටු ප්‍රතිස්ථාපනය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ආර්ථික ඉතිහාස කෞතුකාගාරයෙහි පර්යේෂණ ඒකකයක් පිහිටුවීමට අපි බලාපොරොත්තු වෙමු.

## රාජ්‍ය ණය කළමනාකරණය

රජය වෙනුවෙන් ණය නිකුත් කිරීම, කළමනාකරණය හා සේවාකරණය, රාජ්‍ය ණය සුරැකුම්පත් සඳහා මධ්‍යම තැන්පතු පවත්වා ගැනීම හා රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළ වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වගකීම් වේ. මැදිකාලීනව රාජ්‍ය ණයෙහි තිරසාර බව තහවුරු කරන අතර ම, විචක්ෂණශීලී අවදානම් මට්ටමක් සහිතව අවම පිරිවැයක් යටතේ රජයට අවශ්‍ය  අරමුදල් සම්පාදනය සිදු කිරීම තහවුරු කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. තවදුරටත්, ණය කළමනාකරණ උපායමාර්ගයේ අවධානය, සමස්ත ණයෙහි කොටසක් ලෙස විදේශ ව්‍යවහාර මුදලින් පවත්නා ණය ප්‍රමාණය සීමා කිරීම, විදේශ ව්‍යවහාර මුදලින් පවත්නා ණය කළඹෙහි කල්පිරීම සඳහා ගතවන සාමාන්‍ය කාලය වැඩි කිරීම සහ වසරක් තුළ සිදුවන ණය කල්පිරීම් සීමා කිරීම කෙරෙහි යොමු වී පවතී.

පෙර සඳහන් කල හේතු මත, 2019 වසර තුළදී රාජ්‍ය ණය කළමනාකරණය අභියෝග කිහිපයකට මුහුණ දෙන ලදී. මෙම අභියෝග හමුවේ වුවද මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය වෙළඳපොළ පාර්ශ්වකරුවන්ගේ සමපේක්ෂණ පදනම් කරගත් ක්‍රියාකාරීත්වය අවම කිරීම සඳහා වෙළඳපොළ සහභාගීවන්නන් සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ පූර්වෝපායීව කටයුතු කළ අතර, එමගින් ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ණය සේවාකරණය සම්බන්ධයෙන් වන වාර්තාව නොවෙනස්ව තබා ගැනුණි.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු පද්ධතියේ තෙවන අදියර සක්‍රීය කිරීම සඳහා වන වෙළඳපොළ මත පදනම් වූ පිළිගැනීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා, එම නිකුතු පද්ධතියේ කාර්යසාධනය, වෙළඳපොළ සහභාගීවන්නන්ගේ නිරීක්ෂණ සහ ප්‍රතිචාර පදනම් කර ගනිමින් 2019 වසරේදී එම නිකුතු පද්ධතියට නව අංග කිහිපයක් හඳුන්වා දෙන ලදී. මෙම නව අංග, පදනම් පරිණතවීම් (benchmark maturities) සහිත සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් සවිමත් පාදක ඵලදා වක්‍රයක් (benchmark yield curve) ගොඩනැගීමට සහ නිකුතු පද්ධතියේ දෙවන අදියර සඳහා ප්‍රාථමික ගැනුම්කරුවන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා හේතුවේ. මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව මාස හයක කාල පරිච්ඡේදයක් ආවරණය කිරීම සඳහා පූර්ව වෙන්දේසි දින දර්ශනය තවදුරටත් දීර්ඝ කරන ලදී.

2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත 2018 මාර්තු මාසයේදී බලාත්මක කිරීමත් සමඟ වගකීම් කළමනාකරණ අරමුණු සඳහා අමතර අරමුදල් රැස් කිරීමට 2019 ජූලි මාසයේදී පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් සම්මත කරන ලදී. මෙමගින් ණය ඒකරාශීවීම අවම කිරීම සහ කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම මගින් රජයට ඉදිරි කාලය තුළදී මුහුණ දීමට සිදුව ඇති ඇතැම් ප්‍රතිමූල්‍ය අවශ්‍යතා සඳහා කල්තබා සූදානම් වීමට හැකිවන අතර අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර සහ අනෙකුත් ණය පරිණත වීම් හේතුවෙන් ණය වාරික සහ පොලී ගෙවීමේ ව්‍යූහය සුමට කිරීම සිදු කළ හැකිය. දේශීය වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් අරමුදල් රැස් කිරීම සහ වගකීම් කළමනාකරණ රාමුව තුළ අවශ්‍ය ආරක්ෂණ ගොඩනැගීම මහ බැංකුව මගින් දැනටමත් ආරම්භ කර ඇති අතර එළඹෙන ණය සේවාකරණ වගකීම් සම්බන්ධයෙන් මෙම මෙහෙයුම් 2020 වර්ෂයේදී සහ ඉන් අනතුරුව අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළඳපොළ නිකුතු පදනම විවිධාංගීකරණය කිරීමේ අරමුණින් විකල්ප බැඳුම්කර වෙළඳපොළවලින් අරමුදල් රැස්කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා සලකා බැලෙමින් පවතී.

රාජ්‍ය ණය සුරැකුම්පත් ගනුදෙනුවල විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, 2020 ජනවාරි 01 දින සිට ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය හරහා සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් හුවමාරුවකටම අදාළ මිල, ඵලදා අනුපාතය හා පියවීම් වටිනාකම ලබාගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කර ඇත. රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිසංස්කරණ සමඟ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ඉලෙක්ට්‍රොනික වෙළඳ පද්ධතියක් (electronic trading platform) සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරයක් (central counterparty arrangement) ස්ථාපිත කිරීමට අප විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. භාණ්ඩාගාර බිල්පත් සඳහා නව ප්‍රාථමික නිකුතු පද්ධතියක් සහ ද්විතීයික වෙළඳපොළ වෙළඳාම් හැකියාව ඉහළ නැංවීමට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අන්තර් ජාලය පදනම් කරගත් වෙන්දේසි පද්ධතියක් හඳුන්වා දීමට පියවර ගනු ඇත.

## සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) භාරකරු ලෙස මහ බැංකුව විසින් සිය අරමුදල් කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී. මැදිකාලීනව විවිධාංගීකරණය වූ ආයෝජන උපාය මාර්ගයකට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය සහ අනුමත ආයෝජන මාර්ගෝපදේශ අනුගමනය කරමින්, 2019 වසරේදී රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු සහ කොටස් වෙළඳපොළේ ආයෝජන ක්‍රියාකාරකම් නැවත ආරම්භ කරන ලදී. ආයෝජන කටයුතුවල වැඩි වගවීමකින් සහ විනිවිදභාවයකින් යුතුව, අවදානම් කළමනාකරණ රාමුව සහ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා මූලික පියවර කිහිපයක් ගන්නා ලදී.

ඉදිරියේදී, මධ්‍ය හා දිගු කාලීන වශයෙන්, වෙළඳපොළට සාපේක්ෂව ඉහළ අවදානම් ගැලපුම් ප්‍රතිලාභ අනුපාතයක් ලබා ගැනීම සඳහා සේ.අ.අ. ආයෝජන කළඹ ප්‍රතිතුලනය කිරීමට අපි අපේක්ෂා කරමු. පුළුල් ආයෝජන විවිධාංගීකරණ ක්‍රියාවලියක් තුළින් නව වෙළඳපොළ අවස්ථා සහ උපකරණ උපයෝගී කර ගැනීමට අපි බලාපොරොත්තු වෙමු. තවද, දැනට පවතින පත්‍රිකා මත පදනම් වූ ක්‍රියාවලිය, පූර්ණ ලෙස ඩිජිටල්කරණය

කරන ලද මෙහෙයුම් පරිසරයක් බවට පරිවර්තනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු. සාමාජිකයන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා නව සේවා කවුළුවක් "මෙහෙවර පියස" හි පිහිටුවීමට ද අපේක්ෂා කෙරේ.

## විදේශ විනිමය කළමනාකරණය

විදේශ ණය කළමනාකරණය සම්බන්ධයෙන් විදේශ විනිමය පනතේ විනිවිදභාවය වැඩිදියුණු කරනු ලබන අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ගනුදෙනු තවදුරටත් පහසු කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති විදේශ විනිමය නියාමන, නියෝග සහ විධාන නැවත සලකා බලනු ලැබේ. නීති විරෝධී ලෙස සන්තකයේ තබා ගැනීම්, පැවරීම්, හුවමාරු කිරීම් සහ ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන අනෙකුත් විදේශ විනිමය කටයුතු වැනි විදේශ විනිමය සම්බන්ධ අනවසර ක්‍රියාකාරකම්වලට එරෙහිව කටයුතු කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. බැංකු ක්‍රමය හරහා රටවල් අතර සිදු වන ගනුදෙනු සහ විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පද්ධතියක් වන ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රමවේදයක් (International Transactions Reporting System/ ITRS) හඳුන්වාදීමේ කටයුතුවල ද අපි නිරත වී සිටින්නෙමු. විදේශීය අංශයේ සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම, නියාමන අධීක්ෂණය සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඵලදායී සහ සංකීර්ණ දත්ත එක්රැස් කිරීම සඳහා මෙය පහසුකම් සපයයි. විදේශ විනිමය පනතේ විධාන සඳහා වූ යෝජිත සංශෝධන දැනට අවසන් අදියරේ පවතින අතර, 2020 වසරේ මුල් භාගයේදී අවසන් කිරීමට නියමිතය.

## මූල්‍ය බුද්ධි ඒකකය

2019 වසරේදී මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රමුඛතාව වූයේ මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF) විසින් සපයන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ (AML/ CFT) විෂය පථයෙහි වූ අඩුපාඩු සපුරාලීම අරමුණු කරගත් ක්‍රියාකාරී සැලැස්ම නිසි කාල සීමාව තුළ සාර්ථකව සම්පූර්ණ කිරීමයි. මෙම

ක්‍රියාමාර්ග ගනු ලැබුවේ මූල්‍ය කාර්ය සාධක බලකායෙහි "අළු ලැයිස්තුවෙන්" ශ්‍රී ලංකාව ඉවත් කර ගැනීම සඳහාය. මෙම ඉලක්කය වසර අවසානයේදී සාක්ෂාත් කර ගන්නා ලදී. රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නියමිත වේලාවට නිකුත් කිරීම ඔස්සේ අධීක්ෂණ කාර්යභාරය ද අපි අඛණ්ඩව සිදු කළෙමු.

ඉදිරියේදී, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ කාර්යභාරයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව එක් එක් පාර්ශ්වකරුවන්ට විශේෂිත වූ ප්‍රතිපත්ති ගොඩනැගීම සඳහා අපි ඔවුන් සමඟ සම්බන්ධ වී කටයුතු කරන්නෙමු. එමෙන්ම, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව (NRA) 2020 වසරේදී අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන් සිදු කෙරෙනු ඇත. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ සම්මුති පනතට තවදුරටත් සංශෝධන හඳුන්වා දීමට නියමිතය. එසේම, අවසාන ප්‍රතිලාභ හිමිකාරීත්වයට අදාළව සමාගම් පනත සංශෝධනය කෙරෙනු ඇත. අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින්, "goAML" මාර්ගගත (online) වාර්තාකරණ සහ විශ්ලේෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට කටයුතු කරන අතරතුර එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ ප්‍රාගුණන මූල්‍ය ණය (proliferation financing) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සම්මුතීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කරන්නෙමු. තවද, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්වල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ අවශ්‍යතා ශක්තිමත් කිරීමට අපි නීතිඥයින්, නොතාරිස්වරුන්, ගණකාධිකාරිවරුන්, භාරකරුවන් සහ සමාගම් සේවා සපයන්නන් සඳහා ඒ ඒ අංශයන්ට අදාළ මාර්ගෝපදේශ නිකුත් කරන්නෙමු.

## ප්‍රාදේශීය සංවර්ධනය

ප්‍රාදේශීය සංවර්ධන ගත් කල, රටේ විවිධ ප්‍රදේශවල ආර්ථික සංවර්ධනයේ පවතින විෂමතා තුරන් කිරීම සඳහා අවශ්‍ය අවකාශය පවතින බව අපි විශ්වාස කරන්නෙමු. මේ සම්බන්ධයෙන්, රට තුළ ඵලදායී රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් දරිද්‍රතාව අවම කිරීමට රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වලට සහය වීම සඳහා අනෙකුත් අදාළ ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. දැනට පවතින බලතල යටතේ අපට ප්‍රාදේශීය සංවර්ධනය සඳහා කළහැකි මෙහෙයුම් සහභාගීත්වය සීමිත මට්ටමක පවතී. එහෙත්, සහනදායී ණය මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම තුළින් අපි මෙම ක්ෂේත්‍රය කෙරෙහි අපගේ දායකත්වය පුළුල් කර ඇත්තෙමු. සංවර්ධන මූල්‍ය මූලාරම්භයන්ට අදාළ නව ප්‍රතිපත්ති උපායමාර්ග වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. විධිමත් මූල්‍ය අංශයට කිසිවිටෙකත් ප්‍රවේශ නොවූවන් කෙරෙහි අවධානය යොමු කරමින් 2019 වසර තුළ දී මූල්‍ය සාක්ෂරතා හා කුසලතා සංවර්ධන වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී. මෙම ක්‍රියාමාර්ග සර්ව සහභාගිත්වයක් සහිත සහ තුලනාත්මක ආර්ථික වර්ධනයක් ඇති කිරීමට සහ රට තුළ මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීමට දායක විය.

ඉදිරි කාලය තුළ දී මහ බැංකුව මෙම ක්‍රියාකාරකම් වෙත වැඩි අවධානයක් යොමු කරමින් අඛණ්ඩව කරගෙන යනු ඇත. අනෙකුත් අදාළ බලධාරීන්ගේ සහයෝගය ඇතිව 2020 වසර මුල් භාගයේ දී පළමු මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ ජාතික උපායමාර්ගය (National Financial Inclusion Strategy) ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා සහ කුසලතා සංවර්ධනය, හැකියා ගොඩනැංවීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධව වැඩසටහන් පැවැත්වීම මගින් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම සම්බන්ධව මහජනතාව දැනුම්වත් කිරීමට සහ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට ද ප්‍රයත්න ගනු ලැබේ. ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) තාක්ෂණික සහාය ඇතිව 2020 වසරේ දී ශ්‍රී ලංකාව තුළ පළමු වරට මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් පැවැත්වීමට ද අපි අපේක්ෂා කරන්නෙමු. මෙහෙයුම් කටයුතුවල පරිමාණයන් ඉහළ නැංවීමට කටයුතු කරන අතරතුර, පවත්නා සහ ශක්‍යතාවක් සහිත ව්‍යාපාර, විශේෂයෙන් ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ

ව්‍යාවසායයන් (MSMEs) වැඩිදියුණු කිරීමට කටයුතු කරන අතර, එය සර්ව සහභාගිත්වයක් සහිත සහ තුලනාත්මක වර්ධනයක් ඇති කිරීමට ද හේතු වනු ඇත.

# 5. සමාප්ති සටහන

අභ්‍යන්තර හා බාහිර වාතාවරණයන්ගෙන් පැන නැගුණ ඇතැම් පීඩාවන් මධ්‍යයේ වර්තමානය වන විට ශ්‍රී ලංකා ආර්ථිකය 'ඉහළ මැදි ආදායම්' තත්ත්වයට පත්ව ඇත. ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධවීමේ අඛණ්ඩ ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා ආර්ථිකය අවදානමට ලක්වීමේ හැකියාවක් පවතී. එලෙස ඇති විය හැකි බාධක තුළින් ආර්ථික වර්ධනය හා සමස්ත සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව යන දෙඅංශයම මත පීඩනයක් ඇති කළ හැක. නූතන, ගතික සහ නිර්මාණශීලීත්වයෙන් යුතු ආයතනයක් ලෙස අපේ උරුමය අඛණ්ඩව පවත්වා ගනිමින් සියලුම දෙනා සඳහා අවස්ථා නිර්මාණය කෙරෙන ප්‍රතිලාභ බෙදී යන සහ සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයට උපකාරී වෙමින් අඩු උද්ධමනයක් සහ ස්ථාවර ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අපි ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී අඛණ්ඩව පූර්වෝපායික ලෙස කටයුතු කරන්නෙමු.

මා හට මහ බැංකුවේ අධිපති ලෙස කටයුතු ආරම්භ කිරීම සඳහා බාධාවකින් තොරව පිවිසීමට ඉඩ සලසා දුන් පුද්ගලයින් සහ පාර්ශ්ව කිහිපයකට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීමට සහ ඔවුන්ව අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. පළමුවෙන්ම සහ ප්‍රධාන වශයෙන්,  අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍ය හා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන  අමාත්‍යතුමා මෙන්ම ජනාධිපති ලේකම්තුමා මා කෙරෙහි තබන ලද විශ්වාසය පිළිබඳව අතිශයින් කෘතවේදී වෙමි. ඉදිරි කාලයේ දී එම ධූරයන් සමඟ සමීපව කටයුතු කිරීමට මම බලාපොරොත්තු වෙමි. තවද, මීට ප්‍රථමයෙන් මෙම තනතුර දැරූ ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ඔහුගේ සේවා කාලය තුළ ඇති වූ කැළඹීම් මධ්‍යයේ වුවද මෙම ආයතනයට ලබාදුන් දක්ෂ මඟ පෙන්වීම මගින් අනුප්‍රාප්තිකයාගේ කළමනාකරණය වඩාත් පහසු කිරීම සම්බන්ධයෙන්  ස්තූතිවන්ත විය යුතු ය.

මා මෙම තනතුරෙහි වැඩ අරඹා ගතවූයේ සති කිහිපයක් පමණක් වුවද, භාණ්ඩාගාර ලේකම් සහ මුදල් මණ්ඩල සාමාජික එස්. ආර්. ආටිගල මහතා සහ මුදල් මණ්ඩලයේ

අනෙකුත් සාමාජිකයින් වන නිහාල් ෆොන්සේකා මහතා, ක්‍රිශාන්ත පෙරේරා මහතා සහ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය විසින් මා වෙත ලබා දුන් සහයෝගය දැඩි දිරිගැන්වීමක් සහ විශාල උපකාරයක් වී ඇත. ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය සහ මුදල් මණ්ඩලය තුළ ඔවුන්ගේ අත්දැකීම් ඵලදායී තීරණ ගැනීමට උපකාරී වන බව අමුතුවෙන් කිවයුතු නැත. ඔවුන් හමුවේ ඉදිරිපත් කෙරෙන කාරණා සම්බන්ධයෙන් විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් යුතුව අදහස් සැපයීම සම්බන්ධයෙන් මම ඔවුන්ට කෘතවේදී වෙමි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාට සහ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතාට මාගේ අවංක කෘතවේදීත්වය පළ කළ යුතුය. මා මෙම ධූරයේ ගත කළ දින කිහිපය තුළදී ඔවුන් සමඟ සිදු කළ අදහස් හුවමාරු කර ගැනීම් මා හට විශ්වාසයෙන් යුතුව ඉදිරියට කටයුතු කරගෙන යෑමට උපකාරී විය. මෙම ගෞරවනීය සහ සංකීර්ණ ආයතනය කළමනාකරණය කිරීමේදී ඔවුන්ගේ වෘත්තීමය උපදෙස් මෙන්ම සහයෝගය ලබාගැනීමට මා වාසනාවන්ත වී ඇත.

සහකාර අධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට සහ විශේෂයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලයට ද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා ගත් උත්සාහය වෙනුවෙන් මාගේ අවංක ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. මාගේ මෙම ධූරයේ කටයුතු සඳහා හැඩගැසීමට විශාල වශයෙන් සහාය වූ අධිපති ලේකම්වරිය ඇතුළු අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ මාගේ සහෝදර කාර්යමණ්ඩලය ද කෘතවේදීව සිහිපත් කරමි.

රාජකාරිය පිළිබඳ දැඩි හැඟීමෙන්, වෘත්තීයවේදීත්වයෙන්, තාක්ෂණික විශිෂ්ටත්වයෙන් යුතුව ජාතික කර්තව්‍යයක් ඉටු කරන මහ බැංකු කාර්යමණ්ඩලයේ සියලු දෙනාටම කෘතවේදීත්වය පුද කිරීමට මම කැමැත්තෙමි.

මහ බැංකුව, මුදල් හා මූල්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණයට අදාළ සිය ප්‍රතිපත්ති මහජනතාවට සන්නිවේදනය කිරීමට උත්සාහ කරයි. මෙමගින් ආර්ථිකයේ

පාර්ශ්වකරුවන්ට තාර්කික හා මනා ලෙස දැනුවත් වූ තීරණ ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සඳහා පහසුකම් සපයයි. පාර්ශ්වකරුවන් සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහාද එමඟින් ඉඩ සැලසේ. ඔබ මාගේ පූර්වගාමීන් සමඟ කටයුතු කළ පරිද්දෙන්ම අප රට ඉහළ අභිවෘද්ධියක් කරා ගෙන යෑමට ඔබගේ දායකත්වය සහ සහයෝගය අඛණ්ඩව මා වෙත ලැබෙනු ඇතැයි මම අපේක්ෂා කරමි.

මේ වන විට, ශ්‍රී ලංකාව ආර්ථිකයේ මීළඟ ඉදිරි පිම්ම සිදු කිරීමට උත්සාහ කරයි. දේශීය හා ජාත්‍යන්තර අභියෝග රාශියක් පවතින අතර ඒවායින් බොහෝමයක් ආර්ථික හා ව්‍යුහමය ස්වරූපයක් ගනී. මෙම අභියෝග ජය ගැනීම සඳහා ආර්ථිකය තුළ විභවතාවක් පවතින බව මම තරයේ විශ්වාස කරමි. ශ්‍රීමත් වින්සන් චර්චිල් මහතා ප්‍රකාශ කළ පරිදි "අසුබවාදීන් සෑම අවස්ථාවකම දුෂ්කරතාවයන් දකියි. සුබවාදීන් සෑම දුෂ්කරතාවකම පවතින අවස්ථාවන් හඳුනාගනියි". අප මුහුණ දෙන දුෂ්කරතාවලදී සුබවාදී අවස්ථා දැකීමට අපි ද උත්සාහ ගනිමු. මුදල් කටයුතුවල දී ඉතා වැදගත්ම ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව රටේ සමාජ-ආර්ථික සංවර්ධනයන් කරා ළඟා වීමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරනු ඇත.

නෝනාවරුනි, මහත්වරුනි, ඔබට ස්තූතියි. එසේම ඔබ සැමට 2020 සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.